# 2025 සැප්තැම්බර් මාසයට අදාලව 2025.09.23 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.09.23

**වේලාව** - පෙ.ව. 9.30

**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.08.19 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.09.16 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා 2025.08.19 දින පවත්වන ලද මාසික මහ සභා වාර්තාව සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් තමා විසින් ඉදිරිපත් කළ 2025 ජනවාරි 01 වන දා සිට මේ දක්වා වැය ඇස්තමේන්තු හා සංවර්ධන යෝජනා ඉදිරිපත් කරන ලෙස තමා ඉදිරිපත් කරන ලද යෝජනාව මෙම වාර්තාවේ ඇතුළත් නොවී ඇති බැවින් සංශෝදනය වියයුතු බව පවසා සිටින ලදි.

එම සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම් අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම් අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා කාරක සභා අවස්ථාවේදී සිදුකළ අදහස් දැක්වීමක් බැවින් මෙම වාර්තාවට එම කොටස ඇතුළත් කර නොමැති බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

2025.08.19 දින 05.01.02 යෝජනාව මගින් ඉදිරිපත් කර තිබූ ගම් පිඹුරු අංක 573 අංක 03 දරන සැලැස්මෙහි කැබලි අංක 533 දරන ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් බව තමා දැනුවත් වී නොසිටි බවත් එම ඉඩම බිබිල ප්‍රාදේශීය සතු ඉඩමක් යැයි සිතා තර්ක කළ බව ගරු මන්ත්‍රී පී.කේ. ඩී. රෝහිත පුෂ්පකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගරය නිර්මාණය කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම් කොටසක් බව පෙන්වා දුන් අතර සංශෝධන කිසිවක් නොවූයෙන් 2025.08.19 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

### 02.01. බිබිල කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් සිදු කරනු ලබන ඉදිකිරීම් /අළුත්වැඩියා කර්මාන්තවල තොරතුරු ඉදිරිපත් කිරීම.

ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 4/P/DEV/1/4 හා 2025.06.30 දිනැති ලිපිය හා ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අංක 9/සැල/පොදු-1 හා 2025.06.04 දිනැති ලිපිය මඟින් සියළු ආයතනවල සිදුකරනු ලබන ඉදිකිරීම් අලුත්වැඩියා පිළිබඳව ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය දැනුවත් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව බිබිල කලාප අධ්‍යාපන කාර්යාලයේ මේ වන විට ක්‍රියාත්මක කර්මාන්ත වල විස්තර මා වෙත දන්වා ඇත. ඒ අනුව පහත පරිදි බව නිවේදනය කරමි.

ඇමුණුම 01 බිබිල කලාප අධ්‍යාපන කාර්යාලය

| අ.අ | පාසල | කර්මාන්තය | ගිවිසුමට අනුව වැඩ ආරම්භ කළයුතු දිනය | ගිවිසුමට අනුව වැඩ නිම කළයුතු දිනය (කොන්ත්‍රාත් කරුගේ ඉල්ලීම හා කාර්මික නිළධාරිගේ | කොන්ත්‍රාත් කරු | ගිවිසුම්ගත මුදල රු. | කර්මාන්තය මෙහෙයවීම | ප්‍රතිපාදන ලබා දෙන ආයතනය | වැඩිදුර විස්තර ලබාගත හැකි දුරකතන අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නිර්දේශ මත දිනය දීර්ඝ විය හැකිය ) | | | | | |
| 01. | මො/ පිටකුඹුර ප්‍රාථමික විද්‍යාලය | 30×30 ගොඩනැගිල්ල සම්පූර්ණ අළුත්වැඩියාව | 2025.07.29 | 2025.09.20 | හැලඹ එක්සත් ගොවි සංවිධානය, පිටකුඹර, බිබිල | 808833.41 | බිබිල කලාප අධ්‍යාපන කාර්යාලය | ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යංශය | 055-2266065 බිබිල කලාප අධ්‍යාපන කාර්යාලය |

## <u>02.02.බිබිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විසින් බිබිල ප්‍රාදේශීය සභාව සඳහා විරෝදතාවය ප්‍රකාශ කිරීම සම්බන්ධවයි.</u>

බිබිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රමාණවත් ඉඩක් නොමැති බැවින්

- ඇඳුම් මැසීමේ ශිල්පී
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂන ශිල්පී

යන පාඨමාලා දෙක වර්ල්ඩ් විෂන් ආයතනය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන බවත් මෙම පාඨමාලා දෙක තුළින් ළමුන් 40ක් සඳහා පුහුණු කටයුතු සිදුකරන බවත් මෙම ගොඩනැගිල්ල බිබිල ප්‍රාදේශීය සභාව සතුවීමත් සමඟ රජයේ තක්සේරුවට අනුව ගොඩනැගිල්ල බඳුදීම හෝ වෙනත් වාණිජමය කටයුත්තක් සඳහා යොදා ගැනීම තුළින් රු.82000.00 ක මුදලක් මාසිකව ලබා ගැනීමට හැකි බව තීරණය කරමින් මෙම මධ්‍යස්ථානය තුල පවත්වාගෙන යන ඉහත පාඨමලා දෙක ඉවත් කර ගැනීමට උපදෙස් ලබා දී ඇති බවත්ය.

මෙම තීරණය පිළිබඳව මවිත වන්නේ මහජන ඡන්දයෙන් තේරීපත්ව ඇති ගුරුවරු රැසක් සිටින වත්මන් මන්ත්‍රී මණ්ඩලය ප්‍රදේශයේ ළමුන් 40කගේ වෘත්තීය අධ්‍යාපනයට වඩා මාසිකව ලැබෙන රු.82000.00ක මුදල ලබා ගැනීම වඩා වැදගත් යැයි තීරණය කිරීමය.

ගරු ජනාධිපතිතුමා, විෂය භාර අමාත්‍ය ගරු අමාත්‍යතුමිය ඇතුළු වත්මන් රජයේ ප්‍රමුඛ අවධානය වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි යොමුකර ඇති වත්මන් තත්වය තුළ බිබිල ප්‍රාදේශීය සභාව මේ ආකාරයට ක්‍රියා කිරීම තුළ පෙනී යන්නේ රජයේ දැක්ම හෝ ප්‍රතිපත්ති කෙරෙහි කිසිඳු අවධානයක් යොමු කර නොමැති බවයි.

උසස් පෙළ සමත් හෝ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා යොමුවන දරුවන් වෙනුවෙන් සමාජයේ ඕනෑ තරම් අයිතිකරුවන් සිටින නමුත් සාමාන්‍ය පෙළ අසමත් වන 10 වසරෙත් 9 වසරෙත් පාසල් අධ්‍යාපනය සමාජගත වන දරුවන් කෙරෙහි විශේෂ අවධානයක් සමාජය තුළින් නොලැබෙන තත්වයක් තුළ අන්තරාදායක විෂ මත්ද්‍රව්‍ය , සොරකම් අපරාධ වැනි විවිධ සමාජ විරෝදී ක්‍රියාවන් සඳහා යොමු වීමට වැඩි නැඹුරුතාවයක් ඇති මෙම කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකල යුතුව තිබේ.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණුඅධිකාරියේ මූලික අරමුණ වන්නේ මෙම සමාජ කණ්ඩායම සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබාදීම තුළින් හොඳ ආර්ථික පසුබිමක් සහිතව සමාජගත කිරීමය.

උපාධිය ලබාගෙන රැකියාවක් ලබාගැනීම සඳහා මහ පාරේ උද්ඝෝෂණ කළද සාර්ථක වෘත්තීය පුහුණුවක් ලබන අයෙකු රැකියාවක් ඉල්ලා කිසිදා උද්ඝෝෂණය කර නැත. එසේ වන්නේ පුහුණු ශ්‍රමිකයන් සඳහා හොඳ රැකියා වෙළඳපොලක් රට තුළ පැවතීමයි.

මෙවැනි තත්වයක් තුළ මෙම දරුවන් වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු කිරීම සියලුම රාජ්‍ය නිළධාරීන්ගේ ,සමාජ ක්‍රියාකාරීන්ගේ , පොදු මහජනතාවගේ ද වගකීමයි.

නමුත් බිබිල ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපතිතුමා ,උප සභාපතිතුමා , මන්ත්‍රී මණ්ඩලය ක්‍රියාකර ඇත්තේ මෙම සමාජ තත්වය පිළිබඳව කිසිඳු අවබෝධයක් නොමැතිව බව පෙනේ.

ඔබගේ මෙම ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස ඇඳුම් මැසීමේ ශිල්පීය පාඨමාලාව 2026 ජනවාරි මස සිට බිබිල මධ්‍යස්ථානයෙන් රැගෙන යාමට කටයුතු කර ඇත. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව රැකගැනීම වෙනුවෙන් අප මධ්‍යස්ථානයේ ළමුන් වනුවෙන් තිබූ දේශන ශාලාව සහ කාර්යාල කොටස එකතු කර වර්ල්ඩ් විෂන් ආයතනයේ සහයෝගය ඇතිව පන්ති කාමරයක් සකස් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

මෙම නිසාවෙන් ළමුන් වෙනුවෙන් විවිධ රජයේ විවිධ ආයතන මගින් සිදුකරන දැනුවත් කිරීමේ වැඩසටහන් (නීතිය, සෞඛ්‍ය, බෝ නොවන රෝග, අන්තරාදායක මත්ද්‍රව්‍ය ) දෙමව්පිය හමු වැනි විවිධ වැඩසටහන් පැවැත්වීමේ අවස්ථාව අහිමිව ගොස් ඇත.

කෙසේ නමුත් බිබිල ප්‍රදේශයේ මහජන නියෝජිතයන් ලෙස ප්‍රදේශයේ දුප්පත් ජනතාවගේ දුවා දරුවන් වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපනය ලබාදීමට ඇති මෙම ආයතනය තව දුරටත් සම්පත් ලබා දෙමින් දියුණු කිරීමට කටයුතු සිදුකිරීම වෙනුවට තිබෙන සම්පත් අහිමි වන තත්වයට කටයුතු කිරීම මධ්‍යස්ථාන භාර නිළධාරි ලෙස මාගේද සියලු දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ අසතුට මෙන්ම විරෝදයද මෙයින් ප්‍රකාශ කරන බව දන්වමි. ලෙස බිබිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිළධාරි විසින් විරෝධය ප්‍රකාශ කර ලිපියක් එවා ඇති බවත් ඒ සඳහා පිළිතුරු ලිපියක් යවන බවද නිවේදනය කරන ලදි.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබිම.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

## 03.01. බිබිල පොදු වෙළඳපොල අංක 2A කඩ කාමරයෙහි කුලී මුදල් ගෙවීම සම්බන්ධවයි.

බිබිල පොදු වෙළඳපොල අංක 2A කඩ කාමරයෙහි බඳුකරු වන එච්.එම්.බී. ගුණසේකර මහතා විසින් මෙම කඩ කාමරය අවුරුදු 30ක් පමණ කාලයක් තිස්සේ සිසිල ෆාමසිය නමින් බිබිල ප්‍රාදේශීය සභාව සමඟ විශ්වාසවන්තව ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන ව්‍යාපාරයකි. එම මහතා හට බිබිල ප්‍රාදේශීය සභාව BPS/03/09/03/01 /A-02 හා 2025.03.17 දිනැති ලිපිය මගින් 2024 සැප්තැම්බර් මස සිට 2025 මාර්තු මස දක්වා කුලී මුදල ලෙස රු. 12800.00ක් හා ප්‍රමාද ගාස්තු ලෙස රු.42000.00ක් වශයෙන් රු.170000.00ක මුදලක් 2025.04.03 දිනට පෙර ප්‍රාදේශීය සභාව වෙත ගෙවා අවසන් කරන ලෙස දන්වා ඇත.

නමුත් මෙම මහතා හට හදිසි රෝගාබාධයක් හේතුවෙන් කොළඹ ආසිරි රෝහලෙන් ප්‍රතිකාර ගැනීමට සිදුවූයෙන් එම දිනයට පෙර ගෙවීමට නොහැකිව ඇති බවත් බිබිල ලංකා බැංකු ශාඛාවේ ජංගම ගිණුමෙන් 488396 හා 4883397 දරන චෙක්පත් වලින් පිළිවෙලින් 2025.04.03 හා 2025.05.07 දිනවලදී සභා ගිණුමට බැරකර ඇත.

නමුත් 2025.04.25 දින ගිවිසුම අවලංගු වී ඇති බව බිබිල ප්‍රාදේශීය සභාව දන්වා යවා ඇති බැවින් 2025 මාර්තු මස සිට මේ දක්වා කඩකුලී හා ප්‍රමාද ගාස්තු ගෙවීමට පවතින බවත් රෝගාතුර වීම නිසා මෙම බදුකරු හට මෙම ගෙවීම් කිරීම ප්‍රමාද වී ඇති බවත් නැවත මෙම කඩ කාමරය එම මහතා හටම ලබා දෙන ලෙසත් මීට පසුව මෙවැනි ගෙවීම් ප්‍රමාදවීමක් සිදුනොකර බවත් දන්වා ඇති බැවින් එම මහතා හට 2A කඩ කාමරය ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ කාමරය සම්බන්ධයෙන් 2025.08.19 දින පැවති මය සභාව මඟින් 05.01.05 යෝජනාව යටතේ තීරණයක් ලබාගෙන ඇති බව ගරු මූලාසනය විසින් පෙන්වා දෙන ලදී.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

### 04.01. ගරු මන්ත්‍රී ධම්මික බණ්ඩාර මැතිතුමා

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් 2025 ජුනි 01 වන දින සිට මේ දක්වා සංවර්ධන යෝජනා , ඒ සඳහා වැය ඇස්තමේන්තු හා ඒ සඳහා සිදුකර ඇති වියදම් පිළිබඳ සවිස්තර වාර්තාවක් සියළුම මන්ත්‍රීවරුන් හට ලබාදීම.

### 04.02. ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා

බිබිල ප්‍රාදේශීය සභාව මාසිකව සිදු කරනු ලබන සංවර්ධන යෝජනාවල ප්‍රගති සමාලෝචන වාර්තාවක් මාසික මහ සභාව වෙත ඉදිරිපත් කරන්න.

### 04.03.ගරු මන්ත්‍රී පි.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා

බිබිල ප්‍රාදේශීය සභාවේ පෙර පැවති සභා පාලන සමයෙහි අවසන් වර්ෂ දෙකෙහි ආදායම් වියදම් වාර්තා, කොමසාරිස්තුමා විසින් පාලනය කරන ලද පාලන සමයෙහි ආදායම් වියදම් වාර්තා, හා 2025 වර්ෂයේ ජුනි මස සිට මේ දක්වා ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කරන්න.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු මූලාසනයේ යෝජනා.

### 05.01.01. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල සම්පත් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල බදු දීමේ ගිවිසුම මාසික කුලී පදනමකින් තොරව දීර්ඝ කර ගැනීම සඳහා වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය මගින් සිදු කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමෙහි වර්ල්ඩ් විෂන් ආයතනය මගින් ඉදිකල බිබිල සම්පත් මධ්‍යස්ථාන ගිවිසුම 2024 සැප්තැම්බර් මස අවසන් වූ බැවින් බිබිල ප්‍රාදේශීය සභාව සමඟ නව ගිවිසුමකට එළඹ රු.82000.00ක් මාසික කුලී ගෙවීමට එකඟ වුවද වර්ල්ඩ් විෂන් ආයතනයෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බැවින් කුලී පදනම මත මෙම ගොඩනැගිල්ල ගැනීමට නොහැකි බව දන්වා ඇත.

මෙම ගොඩනැගිල්ල මඟින් බිබිලේ දරුවන්ට, ප්‍රදේශවාසීන්ට සහ ප්‍රදේශයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට විශාල සේවාවක් සිදුවන බැවින් කුලී ගෙවීමකින් තොරව 2033 වර්ෂය දක්වා මෙම සම්පත් මධ්‍යස්ථානය මෙතෙක් පවත්වාගෙන ආ ආකාරයටම පවත්වාගෙන යාමට ඉල්ලුම් කර ඇත. ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව සලසා දෙමින් යෝජනාව පිළිබඳව ගරු මූලාසනය විසින් පැහැදිලි කිරීමක් සිදු කරමින් පවසා සිටියේ ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම අවලංගු වන විට එම ගොඩනැගිල්ලෙහි භාවිතා කරන ලද සියළු උපකරණද සභාව සතු වන බවයි.

ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ බිබිල වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය සහ බිබිල ප්‍රාදේශීය සභාව සමඟ ඇතිකරගෙන තිබූ ගිවිසුම 2024.09.30 දින අවසන් වුවද වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය හා බිබිල වෘත්තීය පුහුණු ආයතනය සමඟ ඇතිකර ගෙන ඇති ගිවිසුම අවසන් වන්නේ 2034 වර්ෂයේදී බවයි.

තවදුරටත් අදහස් දැක්වූ එම මන්ත්‍රී තුමා , බිබිල ප්‍රාදේශීය සභාවට ගොඩනැගිල්ල අයිතිවීම නිසා බිබිල අධ්‍යාපන පදනම සතු රුපියල් ලක්ෂ 26ක පමණ මුදලක් වැය කර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කර එම ස්ථානයට පරිඝණක ගෙන ගොස් ස්ථාපිත කර දරුවන් සඳහා පරිඝණක පාඨමාලා පැවැත්වීමට තීරණය කර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට ආරම්භ කර තිබියදී ගිවිසුම් ප්‍රකාරව මෙම සම්පත් මධ්‍යස්ථානය තුළ ඇති උපකරණද සභාව සතුවන බව දැනුවත් වීමත් සමඟ එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නතර කර ඇති බවත් එම නිසා බිබිල ප්‍රාදේශීය සභාව සතුවන මෙම පරිඝණක යන්ත්‍ර දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණය කර ගැනීමට බලාපොරොත්තු වන පරිඝණක මධ්‍යස්ථානයට ලබාදීම සුදුසු බවත් එසේ ලබාදීමට හැකියාවක් නොමැති නම් බිබිල ප්‍රාදේශීය සභාව මඟින් මෙම පරිඝණක මධ්‍යස්ථානයේ පාඨමාලා පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත් වර්ල්ඩ් විෂන් ආයතනය මඟින් තමා දැනුවත් කළ බවද ප්‍රකාශ කරන ලදී.

මෙම සම්පත් මධ්‍යස්ථානය සභාව සතු ඉඩමක වර්ල්ඩ් විෂන් ආයතනය මඟින් ඉදිකල ද 2024.09.30 දිනෙන් අවසන් වීම නිසා ඒම ගොඩනැගිල්ලෙහි උපකරණද ප්‍රාදේශීය සභාවට හිමිවී ඇති බැවින් එම පාඨමාලා මෙහෙයවීම සඳහා වෘත්තීයමය දක්ෂතා ඇති අයෙකු බඳවා ගෙන පාඨමාලා ඉදිරියට පවත්වාගෙන යමින් ප්‍රාදේශීය සභාව මඟින් පාලනය කිරීමට සුදුසු බවත් ඒ මඟින් රැකියා අවස්ථාවක් උදාවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පවසන ලදි.

වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය මාසික කුලිය රු.82000.00 ක මුදලකට මෙම ගොඩනැගිල්ල කුලී පදනම මත පවත්වා ගෙන යාමට අකමැති බැවින් බිබිලේ දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යනු ලබන ඉදිරි මාස තුන ඇතුළත අවසන් වීමට නියමිත පාඨමාලා අවසන් වන තෙක් මාස තුනක කාල සීමාවකට කුලී අය නොකර මෙම ගොඩනැගිල්ල වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය වෙත ලබා දීමටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සුදුසු යැයි තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.02. 2019 වර්ෂය සඳහා අංක 01 දරණ මුහුදු මාළු වෙළඳ සැල බදු ලබාගත් කේ.එච්.මධුමාල් මහතාගේ ගෙවීමට ඇති කුලී මුදලෙහි ඇතුළත් ප්‍රමාද ගාස්තු මුදලින් සාධාරණ මුදලක් අඩුකර ඉතිරි මුදල වාරික 10කින් ගෙවීම් කිරීමට සලසා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් අංක 01 දරණ මාළු කඩය 2019 වර්ෂය සඳහා  බිබිල , මහියංගන පාර, 1 කණුව ලිපිනයේ  පදිංචි කේ.එච්.මධුමාල් චින්තක යන අය විසින් බදු ලබා ගෙන ඇත. බදු ගිවිසුම් ප්‍රකාරව බදුකරු විසින් මාසිකව රු.37506.67 ක මුදලක් බිබිල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. නමුත් 2019 ජුනි මස සිට 2019 දෙසැම්බර් මස දක්වා මාසික බදු මුදල් ගෙවීම මොහු විසින් පැහැර හැර ඇත. ඒ අනුව මාසික හිඟ කුලී මුදල රු.262,546.69 ක මුදලක් හා ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 315,050.40 ක මුදලක් වශයෙන් රු.577,597.09ක මුළු මුදලක් බදුකරු විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු වේ.

අවස්ථා කිහිපයකදීම ලිඛිතව හා වාචිකව බදුකරු දැනුවත් කළද , ගෙවීම් පහැර හැරීම හේතුවෙන් 2020.01.07 දින එන්තරවාසියක් මඟින් හිඟ මුදල් ගෙවන ලෙස බදුකරු දැනුවත් කලද බදුකරු ගෙවීම් නොකල බැවින් 2022 වර්ෂයේ මෙම බදුකරුට විරුද්ධව ප්‍රාදේශීය සභාව මඟින් නඩු පවරා ඇත. එම නඩුව මේ වනවිට මොණරාගල දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී. මෙම නඩුවට පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ටී.යූ.එස්.කේ. බණ්ඩාර මහා හට 2022 වර්ෂයේ සිට මේ දක්වා නීතිඥ ගාස්තු ප්‍රාදේශීය සභාව මඟින් ගෙවා ඇත.

කේ.එච්. මධුමාල් මහතා විසින් 2025.07.30 දිනැති ලිපිය මගින් මෙම ප්‍රමාද ගාස්තු මුදලින් යම් සාධාරණ මුදලක් අඩුකරදෙන ලෙසත් , ගෙවීමට ඇති ඉතිරි මුදල වාරික 10කින් ගෙවීමට කටයුතු කර දෙන ලෙසත් ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර  මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම අංක 01 දරණ මුහුදු මාළු වෙළඳපල 2019 වර්ෂය සඳහා බදු ලබාගෙන ඇති කේ.එච්. මධුමාල් මහතා බදු මුදල් හා ප්‍රමාද ගාස්තු නොගෙවා නැවතත් ව්‍යාපාර කටයුතු කරගෙන යන බවත් මෙවැනි බදුකරුවන් හට සහන ලබා නොදිය යුතු බවත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු බවත් මෙම බදුකරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අඩු කර අය කළහොත් සභාවට අයවීමට ඇති මුදල් අහිමි කරන බැවින් අධිභාරයට ලක්විය හැකි බවත් ඒබැවින් තමා පෞද්ගලිකව මේ සඳහා අකමැති බව ගරු මන්ත්‍රී එම් .එම් .තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම අංක 01 මුහුදු මාළු වෙළඳසැල බදු ලබාගෙන ඇති කේ.එච්. මධුමාල් මහතා හට මාසිකව ගෙවිය යුතු බදු කුලිය රු.37506.67 කි. එවිට දිනකට බදු කුලිය රු.1250.22 කි. එක් මසකට ප්‍රමාද ගාස්තුව රු.43757.75 කි. එවිට දිනකට ප්‍රමාද ගාස්තුව රු. 1458.59 කි. ඒ අනුව මාසිකව හා දිනකට ගෙවිය යුතු කුලී මුදලට වඩා ප්‍රමාද ගාස්තුවද වැඩි බව ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා පෙන්වා දුන් අතර මෙම බදුකරුවන්ගෙන් මෙම කුලී මුදල් අය කලයුතු වුවද මෙම  සාමාන්‍ය ජනතාවට මෙවැනි කුලියක් දැරිය හැකිද ? මෙම බදු ක්‍රමය කෙසේ සකස් කළේ දැයි හා සාධාරණයකට ලක් කලයුතු දැයි සාකච්ඡා කිරීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

මෙම බදුකරු හට මෙලෙස ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවන්නේ මාසික කුලිය නොගෙවීම නිසා බැවින් බවත් මෙම සභාව සතු මාළු වෙළඳසැලක පවත්වාගෙන යනු ලබන මාළු වෙළඳාම පමණක් නොව විවිධ මාර්ග වල මෙම බදුකරුවන් වෙළඳාම් කටයුතු සිදුකරගෙන  යන බවත් ඒ මඟින් ආදායම් උත්පාදනය කරගනු ලබන බවත් මෙම වෙළඳසැලෙන් පාඩු ලබන බව පවසමින් සහන ඉල්ලුම් කරන

බව පැවසූ ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා බඳුකරුවන්ගෙන් කුලිය හා ප්‍රමාද ගාස්තු සියල්ල අයකල යුතු බවත් මෙම කඩ කාමර සඳහා නඩු පවරා ඇති බැවින් ගරු අධිකරණයේ තීන්දුව ලැබෙන තෙක් සභාවෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් සහන ලබාදීමට නුසුදුසු බව පැවසීය.

මෙම බඳුකරු මීට පෙරද මෙසේ මාළු වෙළඳසැලෙහි ආදායම් උත්පාදනය කරගත නොහැකිව පාඩු ලබන බව පවසමින් ප්‍රාදේශීය සභාව මඟින් සහන ලබාගෙන නගරයෙන් පිටත (නගරයේ සිට කි.මී.1කට ඇතින්) මාළු වෙළඳාම් කරන බවත් දිගින් දිගටම පුරුද්දක් ලෙස මෙලෙස කිරීම නිසා මීට පෙර පැවති සභා පලනයන් මඟින් මෙම බඳුකරු හට මාළු වෙළඳසැල බඳු ලබා නොදීමට තීරණය කර තිබූ බවත් එබැවින් මෙම බඳුකරුගෙන් කුලිය හා ප්‍රමාද ගාස්තු අයකර මහජන සුභ සිද්ධිය සඳහා වැයකිරීම සුදුසු බවත් ප්‍රමාද ගාස්තු අඩු කිරීමට තමා අකමැති බව ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා, තමාද සභාවට කුලී අයකිරීමට විරුද්ධ නොවන බවත් මෙම ප්‍රමාද ගාස්තු අයකරන ආකාරය පිළිබඳ සාකච්ඡා කළයුතු බව පැවසූ බව ප්‍රකාශ කරන ලදී.

ටෙන්ඩර් මඟින් කඩකාමර බඳු ලබාගෙන ඇති බඳුකරුවන් සුන්දර ජීවිත ගතකරන මිනිසුන් නොවන බවත් ඉතා අසීරුවෙන් ජීවිතය ගතකරන පුද්ගලයින් බවත් ප්‍රකාශ කළ ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා මෙම සභාවට කිසිඳු මුදලක් නොගෙවා ගම්වලට වාහන වලින් ගොස් මාළු වෙළඳාම් කරන වෙළඳුන් සිටින බවයි. එබැවින් සභාවට කුලිය ගෙවන මෙම වෙළඳුන්ට සහනයක් ලබාදීමට සුදුසු බවත් ප්‍රමාද ගාස්තු වලින් යම් ප්‍රමාණයක් අඩුකර අයකරන මෙන් ඉල්ලීමක්ද කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අංක 01 දරණ මුහුදු මාළු වෙළඳසැල 2019 වර්ෂයේ බඳු ලබාගෙන ඇති කේ.එච්.මධුමාල් මහතාගෙන් අයවීමට ඇති සම්පූර්ණ බඳුකුලී මුදල අය කිරීමට හා අයවීමට ඇති ප්‍රමාද ගාස්තු මුදලින් 50%ක් අඩුකර අයකිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා විසින් මෙම ප්‍රමාද ගාස්තු 50%ක් අඩුකර අයකිරීමට තමා අකමැති බවත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දෙන්නේ නම් තමාද මේ සඳහා එකඟ බවත් ප්‍රකාශ කරන ලදී.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.03. 2019 වර්ෂය සඳහා අංක 03 දරණ මුහුදු මාළු වෙළඳ සැල බදු ලබාගත් ඩී.එම්.නිලන්ත චාමර මහතාගේ ගෙවීමට ඇති කුලී මුදලෙහි ඇතුළත් ප්‍රමාද ගාස්තු මුදලින් සාධාරණ මුදලක් අඩුකර ඉතිරි මුදල වාරික 10කින් ගෙවීම් කිරීමට සලසා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් අංක 03 දරණ මාළු කඩය 2019 වර්ෂය සඳහා බිබිල , නාගල හෙළදිග්ගොම්මන ලිපිනයේ පදිංචි ඩී.එම්.නිලන්ත චාමර යන අය විසින් බදු ලබා ගෙන ඇත. බදු ගිවිසුම් ප්‍රකාරව බදුකරු විසින් මාසිකව රු.54,173.33 ක මුදලක් බිබිල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය. නමුත් 2019 ජුලි මස සිට 2019 දෙසැම්බර් මස දක්වා මාසික බදු මුදල් ගෙවීම මොහු විසින් පැහැර හැර ඇත. ඒ අනුව මාසික හිඟ කුලී මුදල රු.325,040.02 ක මුදලක් හා ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 341,289.90 ක මුදලක් වශයෙන් රු.6,663,229.92ක මුළු මුදලක් බදුකරු විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු වේ.

අවස්ථා කිහිපයකදීම ලිඛිතව හා වාචිකව බදුකරු දැනුවත් කළද , ගෙවීම් පහැර හැරීම හේතුවෙන් 2020.01.07 දින එන්තරවාසියක් මඟින් හිඟ මුදල් ගෙවන ලෙස බදුකරු දැනුවත් කලද බදුකරු ගෙවීම් නොකල බැවින් 2022 වර්ෂයේ මෙම බදුකරුට විරුද්ධව ප්‍රාදේශීය සභාව මඟින් නඩු පවරා ඇත. එම නඩුව මේ වනවිට මොණරාගල දිසා අධිකරණයේ විභාග වෙමින් පවතී. මෙම නඩුවට පෙනී සිටීම වෙනුවෙන් නීතිඥ ටී.යූ.එස්.කේ. බණ්ඩාර මහා හට 2022 වර්ෂයේ සිට මේ දක්වා නීතිඥ ගාස්තු ප්‍රාදේශීය සභාව මඟින් ගෙවා ඇත.

ඩී.එම්. නිලන්ත චාමර මහතා විසින් 2025.07.30 දිනැති ලිපිය මගින් මෙම ප්‍රමාද ගාස්තු මුදලින් යම් සාධාරණ මුදලක් අඩුකරදෙන ලෙසත් , ගෙවීමට ඇති ඉතිරි මුදල වාරික 10කින් ගෙවීමට කටයුතු කර දෙන ලෙසත් ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අංක 03 දරණ මුහුදු මාළු වෙළඳසැල 2019 වර්ෂයේ බදු ලබාගෙන ඇති ඩී.එම්. නිලන්ත චාමර මහතාගෙන් අයවීමට ඇති සම්පූර්ණ බදුකුලී මුදල අය කිරීමට හා අයවීමට ඇති ප්‍රමාද ගාස්තු මුදලින් 50%ක් අඩුකර අයකිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.04. මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ **2025.08.22** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් LL7517 කෘෂ කැබ් රථයේ ගලවා බලා අභ්‍යන්තරයේ සිදුකළ යුතු අළුත්වැඩියාවන් හදුනා ගැනීම සඳහා බිබිල මයිකල් මොටර්ස් ආයතනය වෙත යොමු කිරීම.

2. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් LL7517 කෘෂ කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා යෙදිය යුතු අමතර කොටස් එම රථයේ නියෝජිත ආයතනය වන ඉන්ද්‍රා මෝටර්ස් වෙතින් මිල ගණන් කැඳවා මිලදී ගැනීම.

3. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් LO 2926 ජල බවුසර් රථයේ මයිලෝ මීටරය හා ඉන්ධන මීටරය අළුත්වැඩියා කිරීම සඳහා බිබිල තරිඳු මෝටර්ස් ආයතනය වෙත යොමු කිරීම.

4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල ,නාගල හා කොටගම පුස්තකාලවල භාවිතයෙන් ඉවත් කර ඇති පෙර වර්ෂවලට අයත් පුවත්පත් වෙන්දේසි කිරීම.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන අලුත්වැඩියා කිරීම සිදුකරනු ලබන්නේ මයිකල් මෝටර්ස් ආයතනනයෙන් දැයි ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05 මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

**2025.09.02** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හාමාපොළ සහ බුළුපිටිය වසම්වල ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන සඳහා බාස්මතී සහලෙන් පිසින ලද බත්, බෝංචි ව්‍යංජනය, කඩල ව්‍යාංජනය, කොළ මැල්ලුමක්, බටු මෝජුවක්, පපඩම් හා චිකන් සහිත කෙසෙල් කොළෙන් ඔතා ලන්ච්ෂීට් එකකින් ආවරණය කරන ලද බත් පාර්සල් 40 ක් හා යෝගට් 40 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

2. බිබිල ප්‍රාදේශීය සභාවේ සේවය කරන ක්ෂේත්‍ර කම්කරු/ සෞඛ්‍ය කම්කරු මහත්ම මහත්මීන් අතරින් නිල ඇඳුම් භාවිතා කරන සේවකයින් 35 දෙනෙකු සඳහා 2025 වර්ෂයට අදාළව නිල ඇඳුම් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

3. බිබිල ප්‍රාදේශීය සභාව අයත් පුවක්පැලේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වීදුරු කපන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම - 2025 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ ප්‍රතිපාදන වෙන් කරමින් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් වීදුරු කපන යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA 5419 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ෆෑන් බෙල්ට් එක ධාවන තත්වයට සුදුසු මට්ටමක නොමැති බැවින් නව ෆෑන් බෙල්ට් එකක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

5. පළාත් පාලන සතිය වෙනුවෙන් වියදම් දැරීම සඳහා රු.100,000.00 අත්තිකාරමක් ලබාදීම.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මුදල් හා ප්‍රතිපත්ති කමිටුව මඟින් පළාත් පාලන සතිය වෙනුවෙන් වියදම් දැරීම සඳහා රු.100000.00ක අත්තිකාරමක් ලබාදීමට කර ඇති නිර්දේශය හා මව්වරුන් සඳහා ලබාදී ඇති පෝෂණීය ආහාර වේල සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදුකරන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ගරු මූලාසනයෙන් ඉල්ලීමක් කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් පළාත් පාලන සතිය සැප්තැම්බර් මාසයේ 15 දින සිට 21 දින දක්වා පැවැත්වූ බවත් ඒ පිළිබඳව පසුගිය සභාවාරයේ දී ගරු සභාව දැනුවත් කළ බව ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී. සැප්තැම්බර් 17 දින පිටකුඹුර හා බුළුපිටිය වසම්වල අම්මාවරුන් සඳහා පෝෂණීය ආහාර වේලක් ලබාදුන් අතර ඒ සඳහා ප්‍රජාවගේ පරිත්‍යාග ලැබුණු බවත් පළාත් පාලන සතියේ අවසන් දිනය වූ 21 වන දින මෙම ආයතනයේ සේවය කරනු ලබන ඇගයීමට ලක් කල යුතු යැයි තීරණය කළ සෞඛ්‍ය හා මාර්ග කම්කරු මහතුන් ඇගයීමට ලක්කල අතර ත්‍යාග වශයෙන් උණුවතුර බෝතලයක් ලබා දුන් බවත් මේ සඳහා ද ප්‍රජාව විසින් පරිත්‍යාග ලබාදුන් බවත් විශේෂයෙන් මේ වෙනුවෙන් රු.6000.00 ක මුදලක් ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා පරිත්‍යාග කළබව පවසන ලදී. පසුගිය සභා වාරයේදී රු.200000.00ක මුදලක් වෙන් කර ගත්තද ප්‍රජාවගේ පරිත්‍යාග ලැබීම් නිසා එතරම් මුදලක් වැය නොවූ බවත් අත්තිකාරම් වශයෙන් ලබාගත් මුදලින් එදිනෙදා වියදම් දැරීමට සිදුවූ බවත් පැවසීය. පළාත් පාලන සතිය වෙනුවෙන් වැයවූ වියදම් වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින බවත් ගරු මූලාසනය විසින් ගරු සභාව දැනුවත් කරන ලදී.

සභාපතිතුමා විසින් කළ එම පැහැදිලි කිරීම වෙනුවෙන් ගරු මන්ත්‍රී එම්.එම් තිස්ස ගුණසිංහ මැතිතුමා ස්තූති කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06. බිබිල ප්‍රාදේශීය සභාව සතු මහජන බැංකුවේ 0116001000068397 ස්ථාවර ගිණුමෙහි තැම්පතු මුදල සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව විසින් බිබිල මහජන බැංකුවේ අංක 0116001000068397 දරන ගිණුමෙහි ආයෝජනය කර ඇති රු. 2,600,000.00 ක ස්ථාවර තැම්පතු මුදල 2025.10.03 දින කල්පිරෙන බැවින් එම මුදල නැවත ආයෝජනය කිරීමට හෝ සභා අරමුදලට බැරකර ගැනීමට සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර  මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ වන විට බිබිල ප්‍රාදේශීය සභාවෙහි ආදායමට වඩා වියදම් වැඩිවීම හේතුවෙන් වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම හා ගෙවීම් කිරීමට විශාල වවුචර්පත් සංඛ්‍යාවක්  ඇති බැවින්  මෙම තැම්පත් මුදල ලබාගෙන ණය බරින් නිදහස් වීමට සුදුසු බව ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

කොටසර රජමහා විහාරය අවට භූමිය නාගරික පරිසරයක් ලෙස ගැසට් කර ඇති බැවින් එම පන්සල අවට භූමිය ප්‍රාදේශීය සභාව මඟින් පිරිසිදු කිරීම් කටයුතු ආදිය සිදු කිරීමට සිදුවන බවත් මෙම මස පැවති කොටසර පෙරහැර කාල සීමාව තුළදී ප්‍රාදේශීය සභාව මඟින් පිරිසිදු කිරීම් , කුණු ඉවත් කිරීම් ,වීථි ලාම්පු දැමීම හා ඉන්ධන ලබාගෙන පාර මෝටර්ග්‍රේඩර් කිරීම ආදිය සිදුකළ බවත් ,දෙමළ ජනතාවගේ මාර්ගයද ඉන්ධන ලබාගෙන මෝටර් ග්‍රේඩර් කළ බවත් බොකාගොන්න දේවාල මාර්ගය සභාව මගින්ම ඉන්ධන යොදා මෝටර් ග්‍රේඩර් කළ බවත් එවැනි සත් ක්‍රියාවන්ගෙන් ප්‍රාදේශීය සභාවට කිසිදු ආදායමකින් තොරව මුදල් වැය කිරීමට සිදුවූ බව ප්‍රකාශ කළ ගරු සභාපතිතුමා දැනට බිබිල කොටගම විවිධ සේවා සමූපකාර සමිතියට ඉන්ධන සඳහාද රු.200,000.00ක පමණ මුදලක් ගෙවීමට ඇති බවත් එම ගෙවීම් සිදුකර ණය බරින් නිදහස්වීම සඳහා දැනට ආයෝජනය කර තිබෙන රු.2,600,000.00 මුදල ප්‍රාදේශීය සභා අරමුදලට බැර කර ගැනීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු  මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ  මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.  එම අවස්ථාවේදී  යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව  ගරු  මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා  විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාව සතු බිබිල මහජන බැංකුවේ අංක 0116001000068397 දරන ගිණුමෙහි ආයෝජනය කර ඇති රු. 2,600,000.00 ක ස්ථාවර තැම්පතු මුදල 2025.10.03 දින කල්පිරුණු පසු සභා අරමුදලට බැරකර  සභා කටයුතු වලට යොදා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය  සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.07. යන්ත්‍ර වාර්ෂිකව සේවා කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා ආයතනයට අයත් බිබිල මහජන පුස්තකාලයට ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් 2022 වර්ෂයේදී Softlogic Computers (PVT) Ltd ආයතනයෙන් මිලදී ගෙන භාරදී ඇති ,

| **Description** | **Serial Nobers** |
|---|---|
| ZC300 Printer | C3J221800490 |
| ZD230 Printer | D5J214605014 |
| | D5J214605013 |
| LS2208 Printer | Z46T01 |
| | Z46T03 |
| | Z46RT8 |
| | Z46RW5 |

ඉහත මුද්‍රන යන්ත්‍ර 07 වාර්ෂික සේවා කිරීම සඳහා රු.133,340.00 ක් සේවා ගාස්තු ගෙවන ලෙස දන්වා ඇති බැවින් එම මුදල ගෙවා ගිවිසුම් ගතවීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08. 2026 වර්ෂයේ බදු පැනවීමේ යෝජනාව අනුමත කිරීම සම්බන්ධවයි.

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ ආදායම් සම්බන්ධ බදු පැනවීමේ යෝජනාව සම්මත කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා 2026 වර්ෂයට අය කිරිමට යෝජනා කර ඇති වෙළඳ බලපත්‍ර ගාස්තු වැඩි වියයුතු බවත් ගාස්තු අඩුවෙන් අය කිරීම නිසා සභාවේ ආදායම් ඇහිරී ඇති බව පෙන්වා දෙන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 05.01.08.01.2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට බිබිල ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට මොණරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ ඇතුළත දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති සියලුම නිවාසවල, ගොඩනැඟිලිවල, ඉඩම්වල හා ගෙපත් වල 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින්,

01. ප්‍රධාන මාර්ගය දෙපස පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට 8 (8%)ක වරිපනමක්ද,
02. අතුරු මාර්ග (පටුමගවල්) දෙපස පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට 5 (5%)ක වරිපනමක්ද,

    2026 වර්ෂය සඳහා පනවා අයකිරිමටත්,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු 4 තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරිමටත්,

ඒ වරිපනම්, 2026 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් එම වර්ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාල වෙත ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ලබාදීමටත් සුදුසු බවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.02. 2026 වර්ෂය සඳහා අක්කරබදු පැනවීමේ යෝජනාව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් බිබිල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද, ඉහත කී 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2026 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරිමටත්,

ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6)වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීම සුදුසු බව, යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.අත්තානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.03. 2026 වර්ෂය සඳහා පෙරසැරි කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව.

බිබිල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතට අනුකූලව 2009 අප්‍රේල් 17 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු යටතේ ද, බිබිල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, නාගරික සංවර්ධන බලප්‍රදේශයෙන් පිටත විෂයභාර අමාත්‍ය විසින් ප්‍රකාශිත අංක 1816/4 හා 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයට අනුකූලව ද, නාගරික සංවර්ධන අධිකාරී පනතේ ගාස්තු අයකිරීම් වලට අනුකූලව ද, නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ රෙගුලාසි වලට අනුකූලව ද, බිබිල ප්‍රාදේශීය සභාව විසින් අංක 1890 හා 2014.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් පිළිගෙන ක්‍රියාත්මක කෙරෙන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ii වන අතුරු ව්‍යවස්ථාවට අනුව හා අංක 2235/54 හා 2021.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, තාප්ප ඉදිකිරීම, පවත්නා ගෙඩනැගිලිවල අලුත්වැඩියාවන් කිරීම සහ අනුකූලතා සහතික නිකුත් කිරීම ආදී කටයුතු වලදී 2026 වර්ෂයේ අය කළයුතු ගාස්තු පහත පරිදි විය යුතු බවට යෝජනා කරමි.

(1) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 500.00
(2) ඉඩම් කොටස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 1000.00
(3) වීථිරේඛා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තු රු. 1500.00

**<u>නගර සීමාව තුල මූලික සැලසුම් නිරාකරණය නිකුත් කිරීම සහා අලුත් කිරීම සඳහා වන ගාස්තු.</u>**

| සංවර්ධන කාර්යය ස්වභාවය | පෙරසැරි ගාස්තු (බදු රහිත) | |
|---|---|---|
| 1.ඉඩම් අනුබෙදුම් කිරීම | **ඉඩමේ ප්‍රමාණය (ව.මී.)** | **ගාස්තුව (රුපියල්)** |
| | i. ව.මී 150 – 500<br>ii. ව.මී 501 – 1000<br>iii. ව.මී 1001 – 5000 | රු 2,000/-<br>රු 3,000/-<br>රු 7,500/-<br>රු 10.000/- |

| | | |
|---|---|---|
| | iv. ව.මී 5001 – 10000 | |

| | | |
|---|---|---|
| | v. ව.මී.10000 වැඩි | රු. 10000/- + ව.මී.10000කටම වැඩි සෑම ව.මී.1000 කටම හෝ ඉන් කොටසකටම රු 10000/- බැගින් |
| 2.කුඹුරු ඉඩම් සහ පහත් බිම් ගොඩකිරිම. | i. ව.මී 250 දක්වා | රු. 2500/- |
| | ii. ව.මී 250 වැඩි | රු. 2,500/- + ව.මී. 250 ට වැඩි සෑම ව.මී. 100 කටම හෝ ඉන්කොටසකටම රු. 2500/- බැගින් |
| 3.1 මායිම් තාප්ප / රැඳවුම් බැම් ඉදිකිරිම් | දික් මීටර් 1 කට | රු.100/- |
| 3.2 අත්තිවාරමක් සහිත මායිම් වෙන්කිරීම | දික් මීටර් 1 කට | රු. 50/- |
| 4. සංනිවේදන කුලුණු/ ඇන්ටනා කුලුණු/ සම්ප්‍රේෂණ කුලුණු ඉදිකිරිම | රු. 30.000/- | |
| 5.ඉන්ධන පිරවුම්හල් / සේවා ස්ථාන | i. දුම් පරික්ෂා කරන ස්ථාන<br>ii. ඉන්ධන පිරවුම්හල්<br>iii. වාහන සේවා ස්ථාන<br>iv. වාහන සේවා ස්ථාන හා දුම් පරීක්ෂාව<br>v.ඉන්ධන පිරවුම් හල් හා ඒ සම්බන්ධ වෙනත් භාවිතයන් | රු. 25,000/-<br>රු. 75,000/-<br>රු. 50.000/-<br>රු. 75,000/-<br>රු. 150.000/- |
| 6. දැන්වීම් පුවරු | i. ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී. 1කට)<br>II. ඩිජිටල් නොවන දැන්වීම්පුවරු ( ව.මී. 1 කට)<br>III.නාම පුවරු (ව.මී. 1 කට )<br>IV.මාර්ගයට ඉහළින් පවතින දැන්වීම් පුවරු ( Gentries) (ව.මී 1 කට) මාර්ගය | රු. 5000/-<br>රු. 3000/-<br>රු. 1000/-<br>රු. 6000/- |

| | | |
|---|---|---|
| 7. කසල රැස් කිරීමේ අංගනය/ බැහැර කරන ස්ථාන/ කොම්පෝස්ට් අංගන/ සෞඛ්‍ය ආරක්ෂිත කසල යොදා ඉඩම් ගොඩකිරීම හා අදාළ වෙනත් සංවර්ධන කටයුතු. | i.භූමි ප්‍රමාණය වර්ග මීටර් 4000 දක්වා<br><br>ii. භූමි ප්‍රමාණය වර්ග මීටර් 4000 ට වඩා වැඩි | රු.50,000/-<br><br>රු. 50,000/- + වැඩිවන සෑම වර්ග මී.4000 ටම හෝ ඉන් කොටසකටම රු. 10,000/= බැගින් |
| 8. ජලය ආශ්‍රිත ගොඩනැගිලි සහ ජලය ආශ්‍රිත සංවර්ධනයන් | | රු. 50,000/- |
| 9. වාණිජ පරමාර්ථයෙන් කරනු ලබන කළුගල් කැඩීම, ගල් කුඩු කිරීමේ අංගන, පස් කැපීම, පස් සෝදා වැලි ගැනිම,ගොඩ වැලි කැණීම, මැටි හා බොරලු කැණීම. | | රු. 10,000/- |
| 10.<br>i. ඛණිජ සම්පත් කැණීම සඳහා කරනු ලබන පරීක්ෂණ | i. වර්ග කිලෝමීටර් 01 ක් දක්වා | රු. 100,000/- |
| | ii. වර්ග කිලෝමීටර් 01 වැඩි | රු. 100,000/- + වර්ග කිලෝමීටර් 1 ට වැඩිවන සෑම වර්ග කිලෝමීටර් 1 ට හෝ ඉන් කොටසකටම රු.10,000/- බැග |
| II. ඉහත අංක 10(1) ට අමතරව සිදුකරන වෙනත් ඛනිජ | i.වර්ග කිලෝමීටර් 1ක් දක්වා<br>ii.වර්ග කිලෝමීටර් 1ට වඩා වැඩි | රු. 100,000/-<br>රු.100,000/- + වර්ග කිලෝමීටර් 1 වැඩිවන සෑම වර්ග කිලෝමීටරයට හෝ ඉන් කොටසකටම රු. 10,000/- බැග |
| 11. ළමා නිවාස/ වැඩිහිටි නිවාස/ පුනරුත්ථාපන මධ්‍යස්ථාන. | **ඉඩමේ ප්‍රමාණය** | **ගාස්තුව** |
| | i. ව.මී. 400 දක්වා | රු. 2,500/- |
| | Ii. ව.මී. 401 - ව.මී 500 | රු. 5000/- |
| | iii. ව.මී. 501 - ව.මී 750 | රු. 10,000/- |
| | iv. ව.මී.751 -ව.මී.1000 | රු. 20,000/- |
| | v. ව.මී. 1000 ට වැඩි | රු. 20,000/- + ව.මී වැඩි වන සෑම ව.මී. 100ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු500 බැගින් |
| 12. ඉහත 1 සිට 11 දක්වා සඳහන් සංවර්ධන නොවන කාර්යයන් සඳහා | **ගෙබිමේ ප්‍රමාණය** | **ගාස්තුව** |
| | i.ව.මී 400 දක්වා | රු. 5,000/- |
| | ii.ව.මී 401 - ව.මී 500 | රු. 10.000/- |
| | iii.වෙනත් ව.මී 501 - ව.මී 750 | රු. 25,000/- |

| | | |
|---|---|---|
| | iv.ව.මී 751 - ව.මී 1000 | රු. 50,000/- |
| | v.ව.මී. 1000 ට වැඩි | රු. 50,000/- + ව.මී. 1000 වැඩි වන සෑම ව.මී. 100 ක් සඳහාම හෝ ඉන් කොටසකටම රු. 500/- බැගින් |
| 13. ගෙබිම් ප්‍රමාණය වෙනස් නොවී අනුමත සැලැස්මේ සිදු කරනු ලබන අභ්‍යන්තර වෙනස් කිරීම් | වර්ග මීටර් 1000 ක් දක්වා<br><br>වර්ග මීටර් 1000 ට වැඩි | රු. 5000/-<br><br>රු. 10000/- |
| 14. රථවාහන ඇගයීම් වර්තාව සඳහා වන නිරවුල් සහතිකය (Traffic impact Assessment Clearance) | රු. 60,000/- | |
| 15. පාරිසරික ඇගයීම් වාර්තාව සඳහා වන නිරවුල් සහතිකය | ECC- රු.50,000/- | EIA- රු. 150,000/- |
| 16. මූලික සැලසුම් නිරාකරණය අලුත් කිරීම | i. වසරක වලංගු කාලය ඉක්මවීමට පෙර අයදුම් කරන්නේ නම්- මූලික සැලසුම් නිරාකරණ සහතිකය සඳහා ගෙවූ මුදලින් 25% ක මුදලක්<br><br>ii. වසරක වලංගු කාලය ඉක්මවා ගොස් වසරක් තුළ අයදුම් කරන්නේ නම් - මූලික සැලසුම් නිරාකරණ සහතික සඳහා ගෙවූ මුදලින් 50% ක් මුදලක්<br><br>iii. වසරක වලංගු කාලය ඉක්මවීමෙන් පසු අයදුම් කරන්නේ නම් මූලික සැලසුම් නිරාකරණය සඳහා වන සම්පූර්ණ ගාස්තුව. | |
| 17. මූලික සැලසුම් නිරාකරණ සහතිකයේ සහතික කරන ලද පිටපත් සඳහා | රු. 10,000/- | |
| 18.මූලික සැලසුම් නිරාකරණය වෙනත් පාර්ශවයකට පැවරීම | රු. 25,000/- | |
| 19. කඩිනම් සේවය(සියලුමඅවශ්‍යතා හා අදාළ අනෙකුත් ලේඛන සම්පූර්ණ කරන ලද දින සිට වැඩ කරන ලද දින 07 ක් තුළ) | සාමාන්‍ය ගාස්තු මෙන් හතර ගුණයක් අය කළයුතු වේ. | |
| 20. පරිපාලන වියදම් | රු. 5,000/- | |
| 21.ආගමික කටයුතු හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘති වලට අදාළ ගාස්තු | රු. 5000/- ක පරිපාලන ගාස්තුවකට යටත් වේ. | |

| **සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා කාලය දීර්ඝ කිරීම සඳහා වන පෙරසැරි ගාස්තු.** | | |
|---|---|---|
| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු | |
| | **ඉඩමේ ප්‍රමාණය (ව.මී)** | පෙරසැරි ගාස්තු |
| | ව.මී 150 - ව.මී 300 | කැබලි 1ක් සඳහා රු. 1000/- |

| | | |
|---|---|---|
| 1.ඉඩම් අනුබෙදුම් සඳහා | ව.මී 301 - ව.මී 600 | කැබලි 1ක් සඳහා රු. 800/- |
| | ව.මී 601 - ව.මී 900 | කැබලි 1ක් සඳහා රු. 600/- |
| | ව.මී 900 ට වැඩි | කැබලි 1ක් සඳහා රු 500/- |
| 2.මායිම් තාප්ප/ රැඳවුම් බැම් ඉදිකිරීම | දික් මීටර් 1ක් සඳහා | රු. 100/- |
| 3. සංනිවේදන කුළුණු/ඇන්ටනාකුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම | | රු. 40,000/- |
| 4. ඉන්ධන පිරවුම්හල්/ වාහන සේවා ස්ථාන/දුම් පරික්ෂා කරන ස්ථාන | ව.මී. 1 කට | රු. 100/- |
| 5. දැන්වීම් පුවරු | i.ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී.1කට) | රු. 2,500/- |
| | ii. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී. 1 කට) | රු. 1,500/- |
| | iii. නාම පුවරු (ව.මී. 1 කට) | රු. 500/- |
| | iv. මාර්ගයට ඉහලින් මාර්ගය හරහා දැන්වීම් පුවරු (Gentries) (ව.මී. 1 කට) | රු. 1,000/- |
| 6. කසල බැහැර කිරීමේ අංගන/ තාවකාලිකව රැස්කර තබන ස්ථාන/ කොම්පෝස්ට් අංගන / සෞඛ්‍යාරක්ෂිත කසල යොදා ඉඩම් ගොඩකිරීම | හෙක්. 1 දක්වා.<br><br>හෙක්. 1 ට වැඩි | රු. 25,000/-<br><br>රු. 25,000/- + වැඩිවන සෑම හෙක් 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු5,000/බැගින් |

| | **ගෙබිම් ප්‍රමාණය (ව.මී.)** | **නේවාසික (ව.මී.1 කට)** | **(ව.මී.1 කට)** | **නේවාසික නොවන (ව.මී.1 කට)** |
|---|---|---|---|---|
| | | **තනි පුද්ගල** | **මහල් නිවාස** | |
| 7. නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි | ව.මී4.00 දක්වා | රු.20/- | රු.25/- | රු.25/- |
| | ව.මී.401-1000 | රු.22/- | රු.27/- | රු.27/- |
| | ව.මී.1001-1500 | රු.25/- | රු.30/- | රු.30/- |

| | | | | |
|---|---|---|---|---|
| | ව.මී.1501-2000 | රු.25/- | රු.32/- | රු.32/- |
| | ව.මී.2000 ට වැඩි | වැඩිවන සෑම ව.මී.90 ක් සඳහාම රු.2,000/ බැගින් | වැඩිවන ව.මී.90 ක් සඳහාම රු.2,000/ බැගින් | වැඩිවන ව.මී.90 ක් සඳහාම රු.2,000/ බැගින් |

| 8. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන | **වර්ග ප්‍රමාණය** (ව.මී.) | **ගාස්තුව** (රු) |
|---|---|---|
| i.පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමග) | ව.මී. 300 දක්වා | රු. 6,000/- |
| | ව.මී. 301 – 500 | රු.15,000/- |
| ii. සූර්ය පැනල සඳහා වන ගාස්තු | ව.මී. 501 – 1000<br>ව.මී. 1000 ට වැඩි | රු.30,000/-<br>රු.30,000/-+ වැඩිවන සෑම ව.මී 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1,000/- බැගින් |
| 9.i අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වන සේ සිදුකරන වෙනස් කිරීම් හා එකතු කිරීම් | මුලු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව. | |
| ii. ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරිමක් නොමැතිව අනුමත සැලැස්ම තුළ සිදු කරනු ලබන වෙනස් කිරීම්. | මුල් අනුමැතියේදී ගෙවන ලද පෙරසැරි ගස්තුවෙන් 25% | |
| 10. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරිම | රු. 25,000/- | |
| 11.සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරිම | i. ව.මී. 1000 දක්වා | රු. 5,000/- |
| | ii. ව.මී. 1000 ට වැඩි | රු. 10,000/- |

**හරිත ගොඩනැගිලි සහතිකය සඳහා ගාස්තු.**

| **සංවර්ධන කාර්යයේ ස්වභාවය** | **පෙරසැරි ගාස්තුව (බදු රහිත) රුපියල්** |
|---|---|
| 1 සියලුම බාණ්ඩ සඳහා හරිත ගොඩනැගිලි ( සහතිකය සඳහා ලියාපදංචි කිරිම) | රුපියල් 5000/- |
| 2 අවසාන හරිත ගොඩනැගිලි සහතිකය ලබාගැනිම (උපරිම පෙරසැරි ගාස්තු මිලියන 1) | **වර්ග මීටරයකට ගාස්තුව*** |
| i.සහතික මට්ටම | i. රු. 600/- |
| ii.රිදී මට්ටම | ii. රු. 500/- |

| | |
|---|---|
| iii. රන් මට්ටම | iii. රු. 400/- |
| iv.ප්ලැටිනම් මට්ටම | iv. රු. 300/- |
| *අවසාන හරිත ගොඩනැගිලි සහතිකය සඳහා වන අයදුම් පත් භාරදෙනු ලබන අවස්ථාවේදී 75% ක මූලික ගෙවීමක් සිදුකළ යුතුය . | |
| 3. රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ආයතන, ආගමික ස්ථාන, රජයේ සෞඛ්‍ය ආයතන සහ වැඩිහිටි සහ ළමා නිවාස | ව.මී. ට රු.50/- |
| බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී ඉල්ලුම් කර ඇති හරිත මට්ටම හා අනුකූලතා සහතිකය නිකුත් කරන අවස්ථාවේදී ළගා කරගෙන ඇති හරිත මට්ටමෙහි යම් වෙනසක් පවති නම්, ළගා කරගෙන ඇති මට්ටම අනුව ගෙවිය යුතු පෙරසැරි ගාස්තුවෙහි වෙනස ප්‍රතිපූර්ණය කොට අනුකූලතා සහතිකය ලබාගත යුතුය. | |

| පසුවිපරම් හා නිරීක්ෂණ වාර්තාව සඳහා ගාස්තු. | | |
|---|---|---|
| **සංවර්ධන කාර්යයේ ස්වභාවය** | **ගෙබිම් ප්‍රමාණය(වර්ග මීටර්)** | **ගාස්තුව (රුපියල්)** |
| ගොඩනැගිලි ඉදිකිරීම | ව.මී. 900 - ව.මී. 2000 | රු. 3,000/- |
| | ව.මී. 2001 - ව.මී. 5000 | රු. 5,000/- |
| | ව.මී. 5000 වැඩි | රු. 10,000/- |
| | | |

| ආවරණ අනුමැතිය ලබාදීම සඳහා වන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තු වලට අමතරව) | | |
|---|---|---|
| **සංවර්ධන ස්වභාවය** | **අයකල යුතු ගාස්තු ( බදු රහිත)** | |
| 1.අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදුකරන ලද ඉඩම් බෙදීම් සඳහා | ඉඩම් කැබලි 1 ක් සඳහා රු.3,000 බැගින් | |
| **2.** අනුමැතියකින් තොරව ගොඩනැගිලි/ඉදිකිරීම්/ එකතු කිරීම්/ නැවත ඉදිකිරීම් | **නේවාසික**(ව.මී.1කට) | **නේවාසික නොවන** (ව.මී.1කට) |
| i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම් දක්වා) | රු. 200/- | රු. 500/- |
| ii. වහල මට්ටම් දක්වා ඉදිකිරීම් ටැම් සහ බාල්ක ඇතුලුව ඉදිකර ඇති විට (වහලය හැර). | රු. 300/- | රු. 1,000/- |
| **iii.** වහල සහිත බිත්ති ඉදිකිරීම. | රු. 400/- | රු. 15,00/- |
| iv. පදිංචිවීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම. | රු. 500/- | රු. 2,000/- |
| **v.** මායිම් තාප්ප/ රැඳවුම් බිත්ති ඉදිකිරීම් | රු. 200/-(දික් මීටරයක් සඳහා) | රු.500 /-(දික් මීටරයක් සඳහා |
| vi. විදුලි සංදේශ. සම්ප්‍රේෂණ සහ ඇන්ටනා කුලුණු ඉදිකිරීම | බිම්පාදම ඉදිකිරීම රු.150,000/-<br>වහල මුදුන ඉදිකිරීම රු. 100,000/- | |
| 3. අනුකූලතා සහතිකය (COC) ලබා නොගෙන පදිංචි වීම. | දිනකට රු.100/- | |
| 4. වාහන නැවැත්වීමේ ස්ථාන ( පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු)<br>i. සියලුම මහ නගර සභා | සම්මත වාහන නැවැත්වීම - රු.500,000/-<br>ලොරි රථ - රු.1,000,000/-<br>කන්ටේනර් ඇතුළු බහු ඇක්සල් වාහන - රු 2,500,000/- | |

| | | |
|---|---|---|
| ii. නගර සභා | සියලුම වාහන සඳහා | රු. 500,000/- |
| iii. ප්‍රාදේශිය සභා | සියලුම වාහන සඳහා | - රු. 250,000/- |
| 5. රථ වාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිතා කිරීම | එක ඉඩකඩක් සඳහා රුපියල්. 20,000/- ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්විමට පරිවර්තනය වන තෙක් වසරකට 10% ක වර්ධනයක් සහිතව. | |

| අනුකූලතා සහතිකය නිකුත් කිරිම සඳහා ගාස්තු. | | | | |
|---|---|---|---|---|
| **සංවර්ධන කාර්යයේ ස්වභාවය** | **අයකල යුතු ගාස්තු(බදු රහිත)** | | | |
| 1. ඉඩම් අනුබෙදුම් කිරිම | එක් කැබැල්ලක් රු. 1000/- | | | |
| 2. ගොඩනැගිලි ඉදිකිරීම් | **ගෙබිම් ප්‍රමාණය(ව.මි)** | **නේවාසික** | | **නේවාසික නොවන** |
| | | **තනිපුද්ගල** | **මහල්** | |
| | ව.මි.400 දක්වා | රු. 4,000/- | රු.5,000/- | රු.5,000/- |
| | ව.මි.400 ට වැඩි | රු. 4000/- ව.මි 400 ට වැඩිවන සෑම ව.මි1 ට හෝ ඉන් කොටසක් සඳහා රු.15/- බැගින් | රු.5000/- + ව.මි 400 ට වැඩිවන සෑම ව.මි1 ට හෝ ඉන් කොටසක් සඳහා රු.20/- බැගින් | රු.5000/- ව.මි 400 ට වැඩිවන සෑම ව.මි1 ට හෝ ඉන් කොටසක් සඳහා රු. 25/- බැගින් |
| 3.සංනිවේදන කුළුණු, ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු සඳහා | රු. 5,000/- | | | |
| 4. මායිම් තාප්ප හා රැඳවුම් බැම් | දික් මීටර් 1 කට රු. 25/- බැගින් | | | |
| 5. පොදු ගොඩනැගිලි සඳහා වන අනුකූලතා සහතිකය අලුත් කිරීම | රු. 10,000/- | | | |

| භාවිතයන් වෙනස් කිරිම සඳහා සේවා ගාස්තු | | |
|---|---|---|
| | **ගෙබිම් ප්‍රාමාණය (ව.මි)** | **ගාස්තුව (රුපියල්) (බදු රහිත)** |
| **පෙරසැරි ගාස්තු** | 45 දක්වා | 1,000/- |
| | 45 – 90 | 1,500/- |
| | 91 – 180 | 1,750/- |
| | 181 – 270 | 2,000/- |
| | 271 – 450 | 2,500/- |
| | 451 – 675 | 2,750/- |
| | 676 – 900 | 3,000/- |
| | 900 - ට වැඩි | වර්ග මීටර් 900 ට වැඩිවන සෑම වර්ග මීටර් 90 ක් සඳහාම රු. 500/- බැගින් |

| අවසර පත්‍රය සඳහා ගස්තු | |
|---|---|
| i.නේවාසික භාවිතයක් වෙනත්භාවිතයක් සඳහා යොදාගැනිම | වර්ග මීටරයක් සඳහා රු. 750/- |
| ii. නේවාසික නොවන අනිකුත් භාවිතයක් වෙනත් භාවිතයක් සඳහා යොදාගැනිම | වර්ග මීටරයක් සඳහා රු.500/- |

**සටහන:**
ඉහත සඳහන් ගාස්තු වලට අමතරව ස්ථානීය පරික්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු වශයෙන් කිලෝ මීටරයකට රුපියල් 50/- ක අතිරේක ගාස්තුවක් අය කෙරේ.කෙසේ වෙතත්, නාගරික සංවර්ධන අධිකාරිය/ පළාත් පාලන ආයතනය විසින් වෙළඳපොලේ ඉන්ධන මිලෙහි වෙනස්කම් අනුව මූලික ගාස්තුව වෙනස් කරනු ලැබිය හැක.

| **නගර සීමාවෙන් පිටත ගොඩනැගිලි අයදුම්පත් පෙරසැරි කිරීමේ ගාස්තු.** | | |
|---|---|---|
| **01.ගොඩනැගිලි ඉදිකිරීම/පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/නැවත ඉදිකිරීම.** | | |
| ගෙබිමේ විශාලත්වය (වර්ග මීටර් වලින්) | පදිංචිය සඳහා (රු) | වාණිජ හෝ වෙනත් භාවිතය සඳහා(රු.) |
| 45ට අඩු | 500.00 | 1000.00 |
| 45-90 | 1500.00 | 2000.00 |
| 91-180 | 2500.00 | 3000.00 |
| 181-270 | 3500.00 | 4000.00 |
| 271-450 | 4500.00 | 6000.00 |
| 451-675 | 5500.00 | 8000.00 |
| 676-900 | 6500.00 | 10000.00 |
| 901-1225 | 7500.00 | 12000.00 |
| 1225ට වැඩි | 7500.00 | 12000.00 |
| ව.මී.1226 ඉක්මවීමෙන් පසු | සෑම ව.මී.90ක් සඳහාම රු.1000.00 බැගින් | සෑම ව.මී.90ක් සඳහාම රු.12500.00 බැගින් |
| íi.ඉඩම් අනුකොටස් කිරීමේ පෙරසැරි ගාස්තු | | |
| <u>බිම් කට්ටි</u> <u>වර්ග ප්‍රමාණය</u> | පර්චස් <u>ප්‍රමාණය</u> | එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු <u>බිම් කොටස් හැර)</u> රු. ශත |
| ව.මී.150-300 | 5.93-11.86 | 500.00 |
| ව.මී.301-600 | 11.87-23.72 | 400.00 |
| ව.මී.601-900 | 23.73-35.58 | 300.00 |
| ව.මී.900 ටවැඩි | 35.39 ටවැඩි | 200.00 |
| íii. මායිම් තාප්ප/ආරක්ෂක බැමි | | |
| | නේවාසික දික්මීටර්<u>1ක් සඳහා ගාස්තුව</u> | වාණිජ හා වෙනත් වර්ග <u>දික්මීටර් 1ක් සඳහා</u> |
| ගොඩනැගිලි සීමාවෙන් පිටත | -රු.300.00 | රු.400.00 |
| ගොඩනැගිලි සීමාව තුල | -රු.500.00 | රු.600.00 |

| | |
|---|---|
| iv. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම | - ව.මී.150ට අඩු ව.මී.1500ක් සහ එයට වැඩි සීමා ව.මී.150 කට රු.1000.00 බැගින් |
| v. . දුරකතන කුළුණු/ඇන්ටනා  කුළුණු ඉදිකිරීම | උස මීටර් 5 - 20 දක්වා රු.20000.00 ක් සහ වැඩි වන සෑම මීටර් එකකටම රු.100.00 බැගින් |
| vi. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත්කිරීම | සෑම රුපියල් මිලියන 5කට රු.5000.00ක් සහ වැඩිවන එකකට රු.100.00 බැගින් |
| 02 **නේවාසික සඳහා වු ඒකකයක  - පෙරසැරි කිරීමේ ගාස්තු** | |
| **භාවිතය වෙනස් කිරීම** | |
| ගෙබිම් ප්‍රමාණය(වර්ගමීටර්) | රු.ශත |
| 45ට අඩු | 500.00 |
| 45-90 | 1000.00 |
| 90-180 | 1250.00 |
| 181-270 | 1500.00 |
| 271-450 | 1750.00 |
| 451-675 | 2000.00 |
| 676-900 | 2250.00 |
| 900ට වැඩි | 2250.00 |
| ව.මී.901ට වැඩි වන එක් එක්<br>ව.මී.90 සඳහා .500.00 බැගින් | |
| **03.අනුකූලතා සහතික නිකුත් කිරීමේ ගාස්තු** | |
| (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබාගත යුතුය.) | |
| ඉඩම් අනුබෙදුම | පළමු බිම් කොටසකට රු.1000.00ක් සහ ඊට වැඩිවන සෑම බිම්කට්ටියකටම රු.500.00 බැගින් |
| නේවාසික ඉදිකිරීම් | ව.මී.300ට අඩු රු.3000.00 සහ ඊට වැඩිවන සෑම ව.මී.1කට රු.10.00 බැගින් |
| වාණිජ හා වෙනත් ඉදිකිරීම් | ව.මී.100ට අඩු රු.3000.00 සහ ඊට වැඩිවන සෑම ව.මී.1කට රු.20.00 බැගින් |
| මායිම්තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම | පළමු දික් මීටර 100 සඳහා රු.1000.00 සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු.10.00 බැගින් |
| ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම | ව.මී.150ට අඩු රු.3000.00 සහ ඊට වැඩි වන සෑම ව.මී.1කට රු.20.00 බැගින් |
| දුරකතන/ විදුලිසංදේශ කුළුණු | උස මීටර් 5 සිට 20 දක්වා රු. 2000.00 සහ ඊට වැඩිවන සෑම මීටර් 1කට රු.100.00 බැගින් |
| විශේෂ ව්‍යාපෘති | කුඩා පරිමාණ සඳහා                    රු.   5000.00 |

| | | |
|---|---|---|
| | මධ්‍ය පරිමාණ සඳහා | රු. 10000.00 |
| | මහාපරිමාණ | රු. 20000.00 |

| **04.** ආවරණ අනුමැතිය ලබාදීම | ආවරණ අනුමැතිය ලබාදීම සඳහා ගාස්තු | | |
|---|---|---|---|
| i. නිසි බලපත්‍රයක් නොමැතිව | එක් එක් බිම්කොටස සඳහා රු.750.00 ක ගාස්තුවක් | | |
| | ඉදිකිරීමේ අදියර | නේවාසික වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු රු. ශත | වාණිජ හා වෙනත්ව.මී.1ක් සඳහා ගාස්තු රු. ශත |
| ii.නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම කොටස් එකතුකිරීම/නැවත ඉදිකිරීම | *. අත්තිවාරම් වැඩ පමණක් (කයිරුමට්ටම) සම්පූර්ණ කොට ඇතිවිට | 200.00 | 500.00 |
| | *. වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇතිවිට | 300.00 | 1000.00 |
| | *වහලය ඇතුළුව ඉදිකොට ඇතිවිට | 400.00 | 1500.00 |
| | *සම්පූර්ණයෙන් ඉදිකොට ඇතිවිට | 500.00 | 2000.00 |
| iii.මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම. | | 400.00 | 400.00 |
| iv.ඉඩම්/කුඹුරු ගොඩ කිරීම | සෑම වර්ග මීටර් 150කට | රු.5000.00 බැගින් | |
| v.දුරකථන/විදුලි සංදේශ කුළුණු | උස සෑම මීටර් 5 කට | රු.10000.00 බැගින් | |
| vi.විශේෂ සංවර්ධන ව්‍යාපෘති | සෑම මිලියන 05කටම | රු.10000.00 බැගින් | |
| vii.අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම/භාවිතා කිරීම හෝ ප්‍රයෝජනය ගැනීම. | එක් දිනකට | රු.100.00 බැගින් | |
| **05.මෝටර් රථ නවතා තැබීම - සේවාගාස්තු** | | | |
| ස්ථාන (නා.සං.අධිකාරී නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියම කර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු) | | සියළුම වාහන සඳහා රු. 250,000.00 | |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08.04. 2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීමේ යෝජනාව.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය හා IV වන උපලේඛනයේ විධි විධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2026 වර්ෂයේදී පහත උපලේඛනයේ i තිරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු ii වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අයකිරිම සුදුසු බවට යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

| i වන තීරුව | ii වන තීරුව |
|---|---|
| **i)**මෝටර් රථයක්, මෝටර් ත්‍රයිකාරයක්, මෝටර් ලොරියක් මෝටර් බයිසිකලයක්,කරත්තයක්, ,බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | රු. 30.00 |
| **ii**) සෑම බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 18.00 |
| ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | රු. 4.00 |
| **iii**) සෑම කරත්තයක් සඳහා | රු. 20.00 |
| **iv)** සෑම අත් කරත්තයක් සඳහා | රු. 10.00 |

1) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථාන වල පමණක් වෙළඳ කාර්යයක් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08.05. 2026 වර්ෂය සඳහා අයාලේ යන ගවයන් හා සතුන් අල්ලා බැඳ තැබීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 වගන්තිය ප්‍රකාරව බිබිල ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථානයක හෝ ඒ අවට බැඳ දිගේලි කර, අයාලේ යන ගවයින්, මී ගවයින් එළුවන් ආදී සතුන් ඇල්ලීමටත්, එසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂය

සඳහා පනවා අයකිරීමට සහ අයාලේ යන සතුන් අල්ලා දින 10ක් ඇතුලත අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාල ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් එමඟින් අයකිරීමටත් සුදුසු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| විස්තරය | රු.ශත |
|---|---|
| • ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතෙකුට) | 10,000.00 |
| • එළුවන් ඇල්ලීමේ ගාස්තුව (එක් සතෙකුට) | 3,000.00 |
| • ගවයින් මී ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට) | 3,000.00 |
| • එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට) | 1,500.00 |
| • ගවයින් හා මී ගවයින් නඩත්තු කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට) | 3,000.00 |
| • එළුවන් නඩත්තු කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට) | 1,500.00 |

- ➢ ප්‍රාදේශීය සභාව බලය පැවරු සතුන් අල්ලා නඩත්තු කරනු ලබන පුද්ගලයන් සඳහා අයකරනු ලබන ගාස්තුවෙන් 75% ක් ගෙවනු ලැබේ. (අදාල සතුන් අල්ලන්නන් සඳහා ගාස්තු සතුන් අල්ලා සභාවට භාරදුන් විටදීම ලබාදිය යුතුය.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.06. 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව.

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව, 2013 ජුනි 28 වැනි දින අංක 1816/43 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අංක 1890 හා 2014.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ක්‍රියාත්මක කෙරෙන අතුරු ව්‍යවස්ථාවල 17 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බිබිල ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමට හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2026 වර්ෂය සඳහා මෙහි පහත සඳහන් පරිදි එක් එක් දැන්වීමකට ගාස්තු අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**උපලේඛනය**

| අනු අංකය | විස්තරය | ගාස්තු රු. ශත |
|---|---|---|
| **01.** | පරිසර හිතකාමීව සකසන ලද රෙදිවලින් මුද්‍රිත බැනර්/කටවුට් ප්‍රදර්ශනය සඳහා | |
| | මාස 1 අඩු කාල සීමාවක් සඳහා (වර්ග අඩි 01 ට) | 100.00 |
| | මාස 1 සිට 3 දක්වා හෝ මාස 3 ට වැඩි කාල සීමාවක් සඳහා (වර්ග අඩි 01 ට) | 150.00 |

**02.** පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා
මාස 1 අඩු කාල සීමාවක් සඳහා (වර්ග අඩි 01 ට) 150.00
මාස 1 සිට 3 දක්වා හෝ මාස 3 ට වැඩි කාල සීමාවක් සඳහා
(වර්ග අඩි 01 ට) 150.00

**03.** ස්ථිර තහඩු වලින් නිමකළ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා (ලිත් වර්ෂයක්)
මුල් වර්ග අඩි 36 දක්වා (වර්ග අඩි 01 ට ) 200.00
වර්ග අඩි 36 ට වැඩි වූ විට (වර්ග අඩි 01 ට ) 300.00

**04.** විදුලි ආලෝක දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය සඳහා (ලිත් වර්ෂයක්)
එක්පැත්තක් ප්‍රදර්ශනය සඳහා (වර්ග අඩි 01 ට ) 300.00
දෙපැත්තක් ප්‍රදර්ශනය සඳහා (වර්ග අඩි 01 ට ) 500.00

**05.** ඩිජිටල් තිර මඟින් නිම කළ ප්‍රචාරණ දැන්වීමක් සඳහා (ලිත් වර්ෂයක්)
එක් පැත්තක් ප්‍රදර්ශනය සඳහා (වර්ග අඩි 01 ට) 200.00
දෙපැත්තක් ප්‍රදර්ශනය සඳහා (වර්ග අඩි 01 ට) 400.00

**පෝස්ටර් ඇලවීම :** වර්ග අඩි 1 කට රු.10.00 බැගින් පෝස්ටර් එකක් සඳහා ලබාදෙන වර්ග අඩි ප්‍රමාණය ගණනය කර පොස්ටර් සංඛ්‍යාවෙන් වැඩි කර අවසර ලබාදිය යුතුයි.( ගාස්තු ගෙවනු ලැබූ සෑම පොස්ටරයකම **"ගෙවන ලදී"** මුද්‍රාව තැබිය යුතුයි)

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.07. 2026 ජංගම වෙළඳාම සඳහා අවසර පත්‍ර ලබාදීම සඳහා ගාස්තු අයකිරීමේ යෝජනාව.

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ සම්මත වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව, 2013 ජුනි 28 වැනි දින අංක 1816/ 43 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 23 වන අතුරු ව්‍යවස්ථාව යටතේ බිබිල ප්‍රාදේශීය සභා සීමාව තුළ ජංගම වෙළඳාම පවත්වා ගෙන යාම සඳහා අවසර පත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි අය කළ යුතුයැයි යෝජනා කරමි.

බිබිල නගරය ආශ්‍රිතව ඇති ජංගම රථ මඟින් (මසකට) රු.8000.00
බිබිල නගරය ආශ්‍රිතව පාන් ඇතුළු බේකරි නිෂ්පාදන අලෙවි කිරිමේ ජංගම රථ
මඟින් (මසකට) රු.5000.00
නගර සීමාව තුළ පොඩි ලොරි රථයක් / ට්‍රක් රථයක් මඟින් ජංගම වෙළඳාම(මසකට) රු.7500.00
නගර සීමාවෙන් පිටත පොඩිලොරි රථයක්/ට්‍රක් රථයක් මඟින්
ජංගම වෙළඳාම (මසකට) රු.3000.00
පොඩි ලොරි රථයක්/ට්‍රක් රථයක් මඟින් ජංගම වෙළඳාම සඳහා (දිනකට) රු. 500.00
නගර සීමාව තුළ ත්‍රීරෝද රථයක් හෝ යතුරු පැදියක් මඟින්
වෙළඳාම සඳහා (මසකට) රු.3000.00

| | |
|---|---|
| නගර සීමාවෙන් පිටත ත්‍රීරෝද රථයක් හෝ යතුරු පැදියක් මඟින් වෙළඳාම සඳහා (මසකට) | රු.2,000.00 |
| ත්‍රීරෝද රථයක් හෝ යතුරු පැදියක් මඟින් වෙළඳාම සඳහා (දිනකට) | රු. 300.00 |
| වෙනත් ජංගම වෙළඳාම් කටයුතු සඳහා (දිනකට) | රු. 1000.00 |
| වඩේ කරත්ත/ කඩල කරත්ත මඟින් වෙළඳාම සඳහා (මසකට) | රු 2,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08.08. 2026 වර්ෂයට අදාළව වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාව.

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බිබිල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බිබිල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තියෙන් බිබිල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ i වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ ii වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූද වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පොල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා ලේකම්වරයා / සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පොලෙහි හෝ පසුගිය වර්ෂය තුළ ලැබීම් වලින් 1 % ක් විය යුතු බවටත්, වෙළඳ බලපත්‍ර ගාස්තු 2026 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

### උපලේඛනය

| **I** වැනි තීරුව | **II** වැනි තීරුව | | |
|---|---|---|---|
| **වෙළෙඳ ව්‍යාපාරයේ ස්භාවය** | **වාර්ෂික වටිනාකම රු.750 නොඉක්මවන විට** | **වාර්ෂික වටිනාකම රු.750 ඉක්මවන එහෙත් රු.1500 නොඉක්මවන විට** | **වාර්ෂික වටිනාකම රු.1500 ඉක්මවන විට** |
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 1. බත් කඩ/ආපනශාලා සහ තේ හෝ කෝපි | 500.00 | 750.00 | 1000.00 |
| 2. බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 3. සංචාරක වෙළෙන්දෝ | 500.00 | 750.00 | 1000.00 |
| 4. සාතක මඩු | 500.00 | 750.00 | 1000.00 |
| 5. කොණ්ඩා කපන ස්ථාන හා බාබර් සාප්පුව | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 6. හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 7. මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. අවමංගල සේවා සැපයීමේ ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |

**පීඩාකාරී ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 10. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. සත්ව පාලනය (මස්,කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. දුම්කොල වියලීම | 500.00 | 750.00 | 1000.00 |
| 18. සත්ව ආහාර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. පුන්නක්කු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. සබන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 21. අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 22. ලෝහ සුන්බුන් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. රස කැවිලි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 28. පොල් ලෙලි නිපදවීම හෝ පල්කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 29. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500.00 | 750.00 | 1000.00 |
| 30. රා එකතු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 31. දැව ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 32. සම් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 33. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 34. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 35. ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 37. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටර් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 38. ගඩොල් පිළිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 40. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 41. කුකුළු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42. ටයර්/ ටියුබ් අළුත්වැඩියා කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 43. සපත්තු/ බෑග්/ සම් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 44. දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

**අන්තරාදායක ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 45. කළුගල් කැනීම හෝ කැඩීම | 500.00 | 750.00 | 1000.00 |
| 46. සිසිල් බීම නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 47. අයිස් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 48. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 49. පාවිච්චි කල ඇඳුම් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 50. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 51. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 52. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 53. පාපැදි හෝ යතුරු පැදි අලුත් වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 54. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 55. විසිතුරු පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 56. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 57. ලෝහ සංස්කාර කර්මාන්ත (ආයුධ, යන්ත්‍රෝපකරණ, උපකරණ නිපදවීම) | 500.00 | 750.00 | 1000.00 |
| 58. වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 59. පොල්තෙල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

**පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 60. ඩ්‍රයික්ලීන් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 61. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 62. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 63. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම හෝ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 64. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 65. ලෝහ වර්ග පෑස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 66. මෝටර් වාහන අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 67. මෝටර් වාහන සේවා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 68. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 69. මෝටර් වාහන බොඩි තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 70. කෘමිනාශක, දිලිර නාශක, පැලෑටි හෝ පලිබෝධනාශක නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 71. ජී.අයි.බාල්දි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 72. වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 73. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 74. වී මෝල් | 500.00 | 750.00 | 1000.00 |
| 75. දුරකතන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 76. විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 77. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියා | 500.00 | 750.00 | 1000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08.09.2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව.**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි i වැනි තිරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධවම එම උප ලේඛනයේ ii වැනි තීරුවේ අනුරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම 2026 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර එකී බද්ද බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උප ලේඛනය

| i වැනි තිරුව | ii වැනි තීරුව | | |
|---|---|---|---|
| කර්මාන්තය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු.750 නොඉක්මවන විට | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු.750 ඉක්මවනඑහෙත් රු.1500 නොඉක්මවන විට | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම රු.1500 ඉක්මවන විට |
| 1. අයිස්ක්‍රීම්/බීම පැකට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 2. කිරි ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 3. මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 4. පැණි නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. අත් යන්ත්‍ර මගින් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. ඉදල්/ කොසු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 7. හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08.10. 2026 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ බිබිල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බිබිල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී පවත්වා ගෙන යන සෑම තැනැත්තකුගේම එම ව්‍යාපාරයේ 2025 වර්ෂයේ ආදායම මෙහි පහත උප ලේඛනයේ i වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකි ii තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කළයුතු බවටත්, බද්දට යටත් යම්

තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු 31 දිනට පෙර බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| i වැනි තීරය | ii වැනි තීරය |
|---|---|
| 2025 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම | රු. ශත |
| රු. 6000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| රු. 6000 – 12000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු. 12000 - 18750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| රු. 18750 – 75000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| රු. 75000 – 150000 නොඉක්මවන අවස්ථාවක | 1,200.00 |
| රු. 150000 ඉක්මවන අවස්ථාවක | 3,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.11. 2026 වර්ෂයට කාබනික පොහොර අලෙවි කිරිමේ ගාස්තු.

2026 වර්ෂයට කාබනික පොහොර අලෙවි කිරීමේ ගාස්තු පහත සඳහන් පරිදි අය කළයුතු යැයි යෝජනා කරමි.

| | | |
|---|---|---|
| කාබනික පොහොර ඇසුරුම් කළ කිලෝ ග්‍රෑම් 1 (1kg) | රු. | 40.00 |
| කාබනික පොහොර ඇසුරුම් නොකළ කිලෝ ග්‍රෑම් 1 (1kg) | රු. | 25.00 |
| කිලෝ ග්‍රෑම් 5 ඇසුරුම් කළ (5kg) | රු. | 200.00 |
| ඇසුරුම් කළ කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 50 (50kg)ට වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමේදී කිලෝ ග්‍රෑම් 1 (1kg) | රු. | 30.00 |
| කාබනික පොහොර කි.ග්‍රෑ.500 ට වඩා තොග වශයෙන් ලබා ගැනීමේදී කි.ග්‍රෑ.1 සඳහා (1kg) | රු. | 20.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.12. 2026 වර්ෂය සඳහා අවසර පත්‍ර ගාස්තු අයකිරිමේ යෝජනාව.

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල අනුව, 2013 ජුනි 28 වැනි දින අංක 1816/43 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අංක 1890 හා 2014.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රය මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන අතුරු ව්‍යවස්ථා මාලාවේ 07 හා 08 අනුව 07 වන අතුරු ව්‍යවස්ථා යටතේ බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයන්හි නියමිත බර සීමාවන් වලින් යුතු වාහන ධාවනය සඳහා අවසර පත්‍ර ලබාදීමෙන් පහත සඳහන් පරිදි ගාස්තුවක් 2026 වර්ෂයේ දී අයකළ යුතු යැයි යෝජනා කරමි.

| විස්තරය | රු. ශත |
|---|---|
| ග්‍රැවල් හෝ පස්, ගල්, වැලි ප්‍රවාහනය සඳහා මසකට මාර්ග භාවිත කිරීමේ අවසර පත්‍රයකට (කියුබ් ප්‍රමාණය සඳහන් නොකල අවස්ථාවක) | 15,000.00 |
| වැලි හෝ ග්‍රැවැල්, පස්, ගල් කියුබ් 01 ක් සඳහා ප්‍රවාහනය වෙනුවෙන් | 250.00 |
| දැව බලපත්‍රයකට ප්‍රවාහනය සඳහා (ප්‍රාදේශීය සභා මාර්ගයක ප්‍රවාහනය කළ හැකි උපරිම දැව ප්‍රමාණය කියුබික් අඩි 100 කි) | 10,000.00 |
| ග්‍රැවල් හෝ පස්, ගල්, මැටල්, වැලි ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා මසකට | 5,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.13. 2026 වර්ෂය සඳහා බිබිල ජල යෝජනා ක්‍රමය මගින් ජල ගාස්තු අය කිරිමේ යෝජනාව.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින්, සපයනු ලබන ජලය සඳහා පහත උප ලේඛනයේ සඳහන් ගාස්තු 2026 වර්ෂයට පනවා අය කිරිම සුදුසු බවට යෝජනා කරමි.

| **ගෘහ, පාසල්, පුණ්‍යායතන හා ආගමික ස්ථාන සඳහා :** | | ඒකකයට අය කිරිම රු:ශත |
|---|---|---|
| ස්ථාවර ගාස්තුව: | රු. 200.00 | |
| ඒකක 01 සිට 10 දක්වා | | 30.00 |
| ඒකක 11 සිට 15 දක්වා | | 35.00 |
| ඒකක 16 සිට 20 දක්වා | | 40.00 |
| ඒකක 21 සිට 30 දක්වා | | 45.00 |
| ඒකක 31 සිට 40 දක්වා | | 50.00 |
| ඒකක 41 සිට 50 දක්වා | | 60.00 |
| ඒකක 51 සිට ඒකකයක් සඳහා | | 70.00 |

- ➢ පුණ්‍යායතන හා ආගමික ස්ථාන සඳහා මාසික බිල්පතකින් 50% ක් පමණක් අය කරනු ලැබේ.
- ➢ මො/ ධර්ම ප්‍රදීප ප්‍රාථමික විද්‍යාලයට ඒකක 100 ක් නිදහස් කරනු ලැබේ.
- ➢ මො/ මහාමාත්‍ය විද්‍යා විද්‍යාලයට ඒකක 200 ක් නිදහස් කරනු ලැබේ.
- ➢ මො/ වෙල්ලස්ස ජාතික පාසලට ඒකක 250 ක් නිදහස් කරනු ලැබේ.
- ➢ බිබිල බාලිකා ළමා නිවාසයට ඒකක 75 ක් නිදහස් කරනු ලැබේ.

(ඉහත පාසල්වල ළමයින් සංඛ්‍යාව මත ඒකක ප්‍රමාණයන් නිදහස් කර ඇත.)

මෙම සියලුම ආයතන වල නිදහස් ඒකක ප්‍රමාණය ඉක්මවා භාවිතා කරන එක් ඒකකයක් සඳහා රු. 30.00 බැගින් ජල ගාස්තු අය කරනු ලැබේ.

**වාණිජ හා රාජ්‍ය ආයතන සඳහා :**

| | <u>රු: ශ</u> |
|---|---|
| ස්ථාවර ගාස්තුව: | රු. 300.00 |
| ඒකක 01 සිට 10 දක්වා | 40.00 |
| ඒකක 11 සිට 15 දක්වා | 50.00 |
| ඒකක 16 සිට 20 දක්වා | 60.00 |
| ඒකක 21 සිට 30 දක්වා | 70.00 |
| ඒකක 31 සිට 40 දක්වා | 80.00 |
| ඒකක 41 සිට 50 දක්වා | 90.00 |
| ඒකක 51 සිට ඒකකයක් සඳහා | 110.00 |

- ඉදිකිරීම් සඳහා හිස් ඉඩම්වලට තාවකාලික ජල සම්බන්ධතතවයන් ලබාදීම . (ඉදිකිරීම අවසන් වූ පසු ස්ථිර ජල සම්බන්ධතාවයකට මාරු කර ගත හැකිය)

| <u>විස්තරය</u> | <u>රු: ශ</u> |
|---|---|
| ස්ථාවර ගාස්තුව : | රු. 400.00 |
| ඒකක 01 සිට 10 දක්වා | 45.00 |
| ඒකක 11 සිට 15 දක්වා | 50.00 |
| ඒකක 16 සිට 20 දක්වා | 65.00 |
| ඒකක 21 සිට 30 දක්වා | 75.00 |
| ඒකක 31 සිට 40 දක්වා | 85.00 |
| ඒකක 41 සිට 50 දක්වා | 95.00 |
| ඒකක 51 සිට ඒකකයක් සඳහා | 110.00 |
| අතිරේක ගාස්තු (මහා පරිමාණ ව්‍යාපෘති සඳහා) | 15000.00 |

ඕනෑම ජල මිටරයක් ක්‍රියා විරහිත වූ විට එම ජල සම්බන්ධතාවයේ ඊට පෙර මාස 03ක ජල පාරිභෝජනයේ සාමාන්‍ය අගය සැලකිල්ලට ගෙන ජල බිල්පත් සකස් කරනු ලැබේ.

ජල මාපක රහිතව ජලය සැපයීමට හැකි උපරිම කාලය මාසයකි. එම මාසය තුළ ජල මීටරයක් සවි නොකළහොත් ජල සම්බන්ධතාවය විසන්ධි කරනු ලැබේ.

| | |
|---|---|
| ජල සම්බන්ධතාවයක් විසන්ධි කිරීමෙන් පසු නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු | රු. 3000.00 |
| ජල බදු නාමලේඛනයේ නම වෙනස් කිරීම සඳහා ගාස්තු | රු. 500.00 |

<u>**තැන්පත්:**</u>

ගෘහ, පාසල්, පුණ්‍යායතන, ආගමික ස්ථාන, වාණිජ හා රජයේ ආයතන හා
හිස් ඉඩම්වලට තාවකාලික ජල සම්බන්ධතා ලබා දීම සඳහා රු. 3000.00

- ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රමය මගින් ජල නළ පද්ධතියට හානි කර අනවසරයෙන් ජලය ලබාගෙන ඇත්නම් පහත කාණ්ඩ 02 යටතේ අය කිරීම් කරනු ලැබේ.

**<u>ප්‍රාදේශීය සභා දේපල වලට අනවසරයෙන් හානි කිරීම වෙනුවෙන් වූ ගාස්තු අය කිරිම.</u>**

| **විස්තරය** | **රු.ශත** |
|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රමය යටතේ ජල සම්බන්ධතාවයක් ලබාගෙන ඇති පාර්ශවයක් අනවසරයෙන් ජලය ලබාගෙන ඇත්නම් අය කරන මුදල | 80000.00 |
| ප්‍රාදේශීය සභාවට අයත් ජල යෝජනා ක්‍රමය යටතේ ජල සම්බන්ධතාවයක් ලබාගෙන නැති පාර්ශවයක් අනවසරයෙන් ජලය ලබාගෙන ඇත්නම් අය කරන මුදල | 125 000.00 |

**<u>අනවසර ජල පරිභෝජනය කිරිම වෙනුවෙන් ගාස්තු</u>**

- ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමය යටතේ ජල සම්බන්ධතාවයක් ලබාගෙන ඇති පාර්ශ්වයක් විසින් සභාව විසින් සවිකරන ලද මීටරයට පිටතින් අනවසරයෙන් ජලය ලබාගෙන ඇති විට එම පාර්ශ්වය විසින් වර්තමානයේ දී දිනකට භාවිතා කරන ජල ඒකක ගණන ගණන් බලා එතැන් සිට ජල සම්බන්ධතාවය අනවසරයෙන් ලබා ගත් දිනය තහවුරු කරගත නොහැකිවිට එම ජල සම්බන්ධතාවය ලබා ගත් දිනය දක්වා කාලයට ජලය භාවිතා කර ඇති ඒකක ගණන ගණනය කර ජල සම්බන්ධතාවය භාවිතා කර ඇති කාර්යය සඳහා අය කරනු ලබන උපරිම මිල යටතේ ජල බිල්පත් සකස් කර එම මුදල අය කරනු ලැබේ.

- ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමය යටතේ ජල සම්බන්ධතාවයක් ලබා ගෙන නොමැති පාර්ශ්වයන් විසින් අනවසරයෙන් ජලය ලබා ගෙන ඇති විට එම පාර්ශ්වයන් විසින් වර්තමානයේ දිනකට අවභාවිතා කරන ජල ඒකක ගණන ගණන් බලා එතැන් සිට ජල සම්බන්ධතාවය ලබා ගත්තා යැයි අනුමාන කරන දිනය දක්වාම ඒකක ගණන ගණනය කර ජල සම්බන්ධතාවය භාවිත කර ඇති කාර්ය සඳහා අය කරනු ලබන උපරිම මිල යටතේ ජල බිල්පතක් සකස් කර එම මුදල අය කරනු ලැබේ.

  (වර්තමාන දිනට පරිභෝජනය කරන ඒකක ගණන, අදාළ කාලය හා භාවිතා කරන ස්වභාවය අනුව තක්සේරු කරනු ලැබේ.)

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08.14. 2026 වර්ෂය සඳහා රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය මගින් ජල ගාස්තු අය කිරීමේ යෝජනාව.</u>

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ එවකට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබූ 1988.08.23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 වන කාණ්ඩය (ජල සම්පාදන) 2 වගන්තිය 3 වන උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිළිගැනීමට තීරණය කර ඇති බැවින්, 1999.01.01 දින සිට බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට සුදුසු බව සම්මත කරගෙන ඇත. ඒ අනුව 34 වන කාණ්ඩය යටතේ බිබිල ප්‍රාදේශීය සභාවට අයත් රතුපස්කැටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින්, 2026 වර්ෂය සඳහා පහත පරිදි ගාස්තු අය කිරීම සුදුසු බව යෝජනා කරමි.

| | ඒකකයකට අයකිරීම් රු:ශත | |
|---|---|---|
| | ගෘහ | වාණිජ |
| අංක 01 සිට 10 දක්වා | 35.00 | 45.00 |
| අංක 11 සිට 15 දක්වා | 40.00 | 50.00 |
| අංක 16 සිට 20 දක්වා | 45.00 | 55.00 |
| අංක 21 සිට 25 දක්වා | 50.00 | 60.00 |
| අංක 26 සිට 30 දක්වා | 55.00 | 65.00 |
| අංක 31 සිට 35 දක්වා | 60.00 | 70.00 |
| අංක 36 සිට 40 දක්වා | 65.00 | 75.00 |
| අංක 41 සිට 50 දක්වා | 75.00 | 85.00 |
| අංක 51 සිට ඒකකයක් දක්වා | 85.00 | 95.00 |

බිබිල ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමයේ කොන්දේසි එලෙසින්ම පවතී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනි සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08.15. 2026 වර්ෂය සඳහා සභාව සතු දේපළ කුලියට දීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව.</u>

බිබිල ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් 2026 වර්ෂය සඳහා මෙහි පහත සඳහන් වූ කාර්යයන් සඳහා කුලියට දීමේදී, එහි ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා අයකල යුතු බව යෝජනා කරමි. (මෙම ගාස්තුව විනෝද බද්ද සහ බලපත්‍ර ගාස්තුවට අමතරව අයකරනු ලබන බිම් බද්දක් වේ.)

| විස්තරය | රු.ශ |
|---|---|

**සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා අයකිරීම**

| | |
|---|---|
| ආදායම් ඉපයීමේ කටයුත්තක් සඳහා (දිනකට) | 10000.00 |
| ආදායම් ඉපයීමේ කටයුත්තක් සඳහා(දින ½ ) | 5000.00 |
| වෙනත් කටයුතු සඳහා (දිනකට) | 8000.00 |
| වෙනත් කටයුතු සඳහා (දින ½) | 4000.00 |

| | |
|---|---|
| රැස්වීම්/සම්මන්ත්‍රණ/උත්සව/ප්‍රදර්ශන කටයුතු සඳහා ශාලාව ලබා ගැනීමේදී අයකරනු ලබන ඇප තැන්පත් | 6000.00 |

| | | |
|---|---|---|
| ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා(දිනකට) | 5500.00 | |
| පෙර දවසේ සූදානම සඳහා වෙන් කිරිම | 1000.00 | |
| සුභසාධන කටයුත්තක් සඳහා (දින ½) | 3000.00 | |
| සුභසාධනකටයුත්තක් සඳහා (දිනකට) | 6000.00 | ඇප |
| තැන්පත් | 6000.00 | |

| | |
|---|---|
| පාසල් හා රාජ්‍ය ආයතනවල උත්සව කටයුතු සඳහා (දිනකට) | 3000.00 |
| පාසල් හා රාජ්‍ය ආයතනවල උත්සව කටයුතු සඳහා (දින 1/2) | 1500.00 |
| ඇප තැන්පත් | 6000.00 |

| | |
|---|---|
| නවාතැන් ගැනීම් හා පහසුකම් භාවිතය සඳහා( රාත්‍රියකට) | 2000.00 |

**සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිරිපිට භූමිය සඳහා අයකිරිම (දිනකට)**

| | |
|---|---|
| ආදායම් ඉපයීමේ කටයුත්තක් සඳහා | 5000.00 |
| වෙනත් කටයුතු සඳහා (රැස්වීම්/ සම්මන්ත්‍රණ/උත්සව/ප්‍රදර්ශන) | 3000.00 |
| සුභසාධන කටයුත්තක් සඳහා (දිනකට) | 2500.00 |
| ඇප තැන්පත් | 2000.00 |

විදුලි බිල
විදුලි ඒකක 60 ට වැඩි වනවිට එම වැඩිවන මුදල ද එකතු කර අය කරනු ලැබේ.

**බිබිල පොදු ක්‍රීඩාපිටිය (දිනකට)**

| | |
|---|---|
| සැණකෙලි/සංදර්ශන හා ආදායම් උපයන කටයුතු සඳහා | 20000.00 |
| ඇප තැන්පත් | 10000.00 |
| රැස්වීම් පැවැත්වීමට හා වෙනත් කටයුතු සඳහා(දිනකට) | 6000.00 |
| රැස්වීම් පැවැත්වීමට හා වෙනත් කටයුතු සඳහා(දින ½) | 3000.00 |
| ඇප තැන්පත් | 4000.00 |

විදුලි බිල
විදුලි ඒකක 60 ට වැඩි වනවිට එම වැඩිවන මුදල ද එකතු කර අය කරනු ලැබේ.

**ප්‍රාදේශීය සභා සම්මන්ත්‍රණ ශාලාව**

| | |
|---|---|
| ආදායම් ඉපයීමේ කටයුත්තක් සඳහා (දිනකට) | 12000.00 |
| ආදායම් ඉපයීමේ කටයුත්තක් සඳහා (දින ½) | 6000.00 |
| ඇප තැන්පත් | 6000.00 |
| වෙනත් කටයුතු සඳහා (දිනකට) | 6000.00 |

| | |
|---|---|
| වෙනත් කටයුතු සඳහා (දින ½) | 3000.00 |
| ඇප තැන්පත් | 3000.00 |
| සුභසාධන කටයුක්තක් සඳහා (දින ½) | 2000.00 |
| සුභසාධන කටයුක්තක් සඳහා (දිනකට) | 4000.00 |
| ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම සඳහා(දිනකට) | 4000.00 |
| නවාතැන් ගැනීම් හා පහසුකම් භාවිතය සඳහා ( රාත්‍රියකට) | 1500.00 |

විදුලි බිල
විදුලි ඒකක 60 ට වැඩි වනවිට එම වැඩිවන මුදල ද එකතු කර අය කරනු ලැබේ.

**බිබිල නගරය තුළ අලෙවි ප්‍රවර්ධන, වෙළඳ ප්‍රචාරක,**

| | |
|---|---|
| උත්සව කටයුතු සඳහා ( දිනකට) | 10000.00 |
| වෙනත් කටයුත්තක් සඳහා | 4000.00 |
| අලෙවි ප්‍රවර්ධන,වෙළඳප්‍රචාරක,උත්සව කටයුතු සඳහා ( දිනකට) | 10000.00 |
| අලෙවි ප්‍රවර්ධන,වෙළඳප්‍රචාරක,උත්සව කටයුතු සඳහා ( දින 1/2) | 5000.00 |
| පෞද්ගලික ස්ථානයක අලෙවි ප්‍රවර්ධන ,වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දිනකට | 4000.00 |

**රථ වාහන හා යන්ත්‍රසූත්‍ර**

**මෝටර් ග්‍රේඩරය** - (ඉන්ධන සහිතව) 8000.00
(අවම පැය 01කට ගෙවිය යුතුයි)
වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශිය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතු අතර වෙළඳපොල ඉන්ධන මිල වෙනස්වීමකදී අයකරගන්නා ඉන්ධන ගාස්තුවද සංශෝධනය වේ.

**බැකෝ ලෝඩරය** - (ඉන්ධන රහිතව) 5000.00
(අවම පැය 01කට මුලින් ගෙවිය යුතුය )

වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශිය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතු අතර වෙළඳපොල ඉන්ධන මිලවෙනස්වීමකදී අයකරගන්නා ඉන්ධන ගාස්තුවද සංශෝධනය වේ

**ටිපර් රථය** (කියුබ් 2.5) 2500.00

කි.මී.2.5 ක් තුළ එක් ටිපර් ලෝඩ් 1 ක් ප්‍රවාහනය
කර නැවත එම ස්ථානයට පැමිණීම සඳහා

වැඩිවන සෑම කි.මී 1 ක් සඳහාම රු.200.00 ක් අය කරනු ලබන අතර ප්‍රවාහනය කරනු ලබන සෑම ටිපර් ලෝඩ් 1 ක් සඳහාම මෙය වලංගු වේ.

**ගල් රෝල (මාර්ග තලනය)** යන්ත්‍ර පැය 1 ක් සඳහා ඉන්ධන රහිතව 5500.00

(වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශිය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතුය)

(යන්ත්‍රය රැගෙන ගිය පසු කාර්මික දෝෂයක් හා යන්ත්‍රක්‍රියාකරු නොමැති විට හැර වැඩ නොමැතිව දින 3 කට වඩා රදවා තබා ගන්නේ නම් එම සෑම දිනකටම රු 1000.00 බැගින් අය කරනු ලබන අතර නැවත වැඩ ආරම්භකරන තෙක් මෙම ගාස්තු අය කිරීම වලංගු වේ.)

| | |
|---|---|
| ට්‍රැක්ටරයට සවි කරන ලද තණකොළ කපන යන්ත්‍රය සඳහා බල ප්‍රදේශය තුළ දිනකට (පැය 8) | 12000.00 |
| ට්‍රැක්ටරයට සවි කරන ලද තණකොළ කපන යන්ත්‍රය සඳහා දින 1/2 (පැය 4) (බල ප්‍රදේශය තුළ) | 6000.00 |

(අවම වශයෙන් පැය 4 කට ගෙවිය යුතුයි.)

**ගලි බවුසරය කුලියට දීම.**

| | |
|---|---|
| බල ප්‍රදේශය තුළ | |
| පළමු වාරයට (පළමු ගලි බවුසරය) | 5000.00 |
| අමතර වාරයකට | 4500.00 |
| බල ප්‍රදේශයෙන් පිටත | |
| පළමු වාරයට (පළමු ගලි බවුසරය) | 6000.00 |
| අමතර වාරයකට | 5000.00 |
| කම්කරු ගාස්තු (එක් වරකට) | 500.00 |
| ධාවනය කරනු ලබන සෑම කි.මී 01 ක් සඳහා | 100.00 |

(අපද්‍රව්‍ය ලබාගන්නා ස්ථානයේ සිට බැහැර කරන ස්ථානය දක්වා යාමට හා ඒමට)

| | |
|---|---|
| සංස්කෘතික මධ්‍යස්ථානය සහ බිබිල පොදු මහජන ක්‍රීඩාංගනය සඳහා ජෙනරේටරය මගින් විදුලිය ලබාදීම සඳහා (දිනකට ඉන්ධන සහිතව) | 30000.00 |
| (පැයකට ඉන්ධන සහිතව) | 4000.00 |
| කථන මේසය කුලියටදීම (දිනකට) (ප්‍රවාහනය කරගත යුතුය) | 1200.00 |

.

කොඩි කණු කුලියට දීම

| | |
|---|---|
| එක් කොඩි කණුවක් සඳහා | 100.00 |

(ප්‍රවාහනය කරගත යුතුය,කොඩිකණු රදවා තබාගැනීමේ කාල සීමාව දින 3 ක් සඳහා පමණි)
ආයතනයෙන් පිටත කොඩි කණු රැගෙන යැමේදී ගෙනයන ප්‍රමාණයෙන් අඩකට ඇපතැන්පතු මුදලක් තැබිය යුතුය
නියමිත දිනට කොඩිකණු ආපසු භාර නොදුනහොත් ප්‍රමාදවන සෑම දිනකටම එක් කොඩිකණුවක් සඳහා රු.50 00 ක දඩ මුදලක් අය කරනු ලැබේ.
සභාව සතු බිබිල සති පොළ ඉදිරිපිට භූමිය කුලියට ලබාදීම.

| | |
|---|---|
| ත්‍රිරෝද රථමගින් සිදු කරනු ලබන පලතුරු අලෙවිකිරීම | 200.00 |
| ලොරි රථ මගින් සිදු කරනු ලබන පලතුරු අලෙවිකිරීම | 350.00 |
| වෙනත් රථ මගින් සිදු කරනු ලබන පලතුරු අලෙවිකිරීම | 350.00 |

ජල බවුසරය

| කාරණය | ජල බවුසරයට දිනකට රු. ශත | පළමු කි.මී.05 ඇතුළත ට්‍රැක්ටරයට යාමට හා ඒමට රු. ශත | පළමු කි.මී. 05 හැර වැඩිවන සෑම කි.මී 01 ක් සඳහා යාමට සහ ඒමට රු. ශත |
|---|---|---|---|
| මළ ගෙදරකට | නොමිලේ | නොමිලේ | නොමිලේ |
| අඩු ආදායම්ලාභීන් සඳහා (ප්‍රාදේශීය ලේකම්,ග්‍රාමනිලධාරි නිර්දේශය මත) | නොමිලේ | රු. 2,000.00 | නොමිලේ |
| නිවාස වල වෙනත් උත්සව සඳහා හා බීමට ජලය ගැනිම | රු. 2000.00 | රු. 2,000.00 | රු. 200.00 |
| නිවාස වල වෙනත් උත්සව සඳහා හා බීමට ජලය සැපයීමේදි ටැංකි වල ජලය පුරවා නැවත රැගෙනඒම. | රු.1500.00 | රු. 2000.00 | රු. 200.00 |
| ඉදිකිරීම් හා සම්බන්ධ කටයුතු සඳහා ජල බවුසරය ප්‍රවාහනය කර භාරදීම | රු. 4000.00 | රු. 2000.00 | රු. 200.00 |
| කොන්ත්‍රාත් කටයුතු සඳහා ජල බවුසරය සමග ටැක්ටරය යොදා ගන්නා අවස්ථා | රු. 4000.00 | දිනකට රු. 9,000.00 උපරිම කි.මී. 60 ක් තුළ | රු. 200.00 |
| ලීටර් 13000 ජල බවුසරය සම්පූර්ණයෙන් පුරවා ලබා ගැනීම සඳහා | රු.10000.00 | රු.2500.00 | රු.250.00 |
| ජලය රහිත හිස් බවුසරය කුලියට ලබා ගැනීම | රු.5000.00 | රු.2500.00 | රු.250.00 |

ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය සඳහා පුරවන ස්ථානයට රැගෙන එන පෞද්ගලික ජල ටැංකි හා ජල බවුසර් සඳහා ජලය පුරවා දීමේදී අය කළ යුතු ගාස්තු

| | |
|---|---|
| ලීටර් 1000 | රු. 500.00 |
| ලීටර් 2000 | රු. 1000.00 |
| ජල බවුසරය | රු. 2000.00 |

**ප්‍රාදේශීය සභා රථගාලේ වාහන නවතා තැබීම වෙනුවෙන් කුලිය අයකිරීම.**

1) යතුරු පැදි පැයකට හෝ ඉන් කොටසක - රු. 50.00
2) ත්‍රීවිලර් පළමු පැය හෝ ඉන් කොටසකට රු. 60.00
   - පළමු පැයෙන් පසුවැඩිවන සෑම පැයකටම රු. 20.00
3) මෝටර් කාර් වෑන් රථ ,ජීප් රථ ,කැබ් ,
   - පළමු පැයට හෝ ඉන් කොටසකට රු. 100.00
   - ඉන් වැඩිවන සෑම පැයකටම රු. 30.00
4) කුඩා ලොරි රථ පැයකට හෝ ඉන් කොටසකට රු. 50.00

5) සෑම දවසකම නවතා තබන වාහනයක් සඳහා (මසකට) රු.5000.00

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එල්.ඒ.බී.වින්තිකා හර්ශනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08.16. 2026 වර්ෂයට අදාළව මෘත ශරීර ආදාහනය කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව.

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෘත ශරිරයක් ආදාහනාගාරයේ ආදාහනය කිරීම සඳහා පහත සඳහන් පරිදි ගාස්තුවක් 2026 වර්ෂයට අයකිරීමට යෝජනා කරමි.

01. බල ප්‍රදේශය තුල මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් අයකරන ගාස්තුව රු. 9500.00
02. බල ප්‍රදේශයෙන් පිටත මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් අය කරන ගාස්තු රු. 10500.00

**<u>හෂ්මාවශේෂ තැන්පත් කිරීම.</u>**

01. ආදාහනාගාර භූමියේ මල් බඳුනක අළු තැන්පත් කර නඩත්තු කිරීමේ ගාස්තු රු. 6000.00 (වසර 3 ක් සදහා පමණි)
02. සුසාන භූමියේ අඩි 1 ½ × 1 ½ වළක තැන්පත් කිරීම සඳහා රු. 3000.00

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.08.17.2026 වර්ෂයට ඉල්ලුම්පත්‍ර සහ වෙනත් සේවාවන් සදහා ගාස්තු අයකිරීමේ යෝජනාව.

2026 වර්ෂයට ඉල්ලුම්පත්‍ර සහ වෙනත් සේවාවන් සඳහා ගාස්තු පහත සඳහන් පරිදි අය කල යුතුයැයි යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | ගාස්තුව රු.ශත |
|---|---|---|
| 01. | පෙර පාසල් ළමුන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා | 100.00 |
| 02. | පුස්තකාල සාමාජිකයින් බඳවා ගැනීමේ අයදුම් පත්‍රයක් සඳහා | 50.00 |
| 03. | ජල සම්බන්ධතා ලබා දීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | 500.00 |
| 05. | ප්‍රසම්පාදන අයදුම්පත්‍ර ගාස්තු(සතිපොල.කඩ කාමර කුලියට දිම) | 4000.00 |
| 06. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු | 500.00 |
| 07. | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100.00 |
| 08. | වරිපනම් බදු නම වෙනස් කිරීමේ ගාස්තු එක් නමක් සඳහා | 2000.00 |
| 09. | බලපත්‍ර හා ලදුපත්,ලේඛන නැවැත පරීක්ෂා කිරීමේ සේවා ගාස්තු | 100.00 |
| 11. | විවිධ සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු | 400.00 |
| 12. | ආයුර්වේදය මගින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයක් සඳහා අය කිරීමේ ගාස්තු | 200.00 |
| 13. | ආයුර්වේදය මගින් සිදුකරනු ලබන රුධිර සීනි පරීක්ෂාව වෙනුවෙන් අය කිරීමේ ගාස්තු | 200.00 |
| 14. | පෙරපාසල් ළමුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු (බිබිල) | 1000.00 |
| 15. | පෙරපාසල් ළමුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු (රදළියද්ද) | 750.00 |
| 16. | කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු අයකිරීම මසකට | 3000.00 |
| 17. | වරිපනම් අය නොකරන ප්‍රදේශයන්ගෙන් කසල ඉවත් කිරීම සඳහා ගාස්තු අයකිරීම මසකට | 1500.00 |
| 18. | ප්‍රාදේශීය සභාව සතු සියලු සුසාන භූමි වල මෘත දේහ තැන්පත් කිරීම සඳහා ගාස්තු (ඉවත් කිරීම වසර 05 න් පස්) | 10000.00 |
| 19. | ඡායා පිටපත් ගැනීම | |
| | A4 තනි පැත්ත (කලු සුදු) | 5.00 |
| | A4 දෙපැත්ත | 10.00 |
| | A3 තනිපැත්ත | 15.00 |
| | A3 දෙපැත්ත | 20.00 |
| 20. | මුද්‍රිත පිටපත් ගැනීම. | |
| | මුද්‍රිත පිටපත්(කලු සුදු) | |
| | A4 තනි පැත්ත | 8.00 |
| | A4 දෙපැත්ත | 12.00 |
| | A3 තනිපැත්ත | 20.00 |
| | A3 දෙපැත්ත | 25.00 |
| 21. | පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | 50.00 |
| 22. | පුස්තකාල සාමාජික අනුපිටපත් නිකුත් කිරීම | 50.00 |
| 23. | බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත සීමාවෙන් පැමිණෙන පාඨකයින් සඳහා සාමාජිකත්වය ලබා දීමේදී අය කරනු ලබන ඇප තැන්පත් | 2500.00 |
| 24. | ඩිජිටල් හැඳුනුම්පත් සකස් කිරීම | 500.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව  සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව  සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09. 2025.08.14 දින පැවති ප්‍රාදේශීය සංවර්ධන කමිටු තීරණයක් වන හෙවෙල්වෙල අඹවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධවයි.

2025.08.14 වන දින පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී හෙවෙල්වෙල අඹවත්ත ග්‍රාම සභා කමිටුව විසින් ඉදිරිපත් කර ඇති බිබිල බදුල්ල මාර්ගයේ **හෙවෙල්වෙල අඹවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය** කිරීම පිළිබඳ යෝජනාව බිබිල ප්‍රාදේශීය සභාව විසින් සිදු කරන ලෙස , බිබිල ප්‍රාදේශීය ලේකම්ගේ අංක MO/BB/PLN/01/01/05 හා 2025.08.26 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. එබැවින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම  පිළිබඳව තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව  සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව  සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10. එච්.එම්. බණ්ඩාර හේරත් මයාගේ ඉඩමේ ප්‍රවේශකත්වය සම්බන්ධවයි.

බිබිල බස්නැවතුම්පොල පිටුපස අරාවවත්ත ඉඩමෙහි පදිංචි එච්.එම්. බණ්ඩාර හේරත් මයා විසින් MO112265 දරන මිනින්දෝරු සැලැස්ම අනුමැතිය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

එහිදී අදාළ භූමියට ප්‍රවේශකත්වය ලබාගන්නේ බිබිල බස්නැවතුම්පොල පරිශ්‍රයෙන් බැවින් ඒ සඳහා පරවශ්‍යතා අයිතිය බිබිල බස්නැවතුම්පොල ඉඩම හිමි ආයතනයෙන් ලිඛිතව ලබාගෙන ඉදිරිපත් කරන ලෙස දන්වා යවන ලදී.

නමුත් එච්.එම්. බණ්ඩාර මයා 2025.09.11 දිනැති ලිපිය මගින් මෙම වාගොල්ල අරාව යන ඉඩමට ප්‍රවේශ මාර්ගය වසර ගණනාවක සිට පාරම්පරිකව භුක්ති විඳින බව දන්වා සිටින අතර එම නිසා මේ සම්බන්ධව නීත්‍යානුකූල අවසරය ලබා දෙන ලෙස ඉල්ලා සිටියි. මේ පිළිබඳව සුදුසු තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වැඩිදුර  තොරතුරු සොයා බලා ඊළඟ මහ සභාව මඟින් තීරණයක් ලබා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11.කණුල්වෙල ගවමස් වෙළඳසැල ප්‍රසිද්ධ ටෙන්ඩර් අනුව ලබා දෙන ලෙස සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශයක් වන කණුල්වෙල ප්‍රදේශයේ දැනට පවත්වාගෙන යනු ලබන ගවමස් වෙළඳසැල 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ ටෙන්ඩර් මගින් වෙළඳසැල බඳු ලබා දී ඇති අතර 2010න් පසුව ටෙන්ඩර් පටිපාටිය වෙනුවට වෙනත් ක්‍රමවේදයක් භාවිතා කරමින් දේශපාලන බලාධිකාරය යටතේ පෞද්ගලික දේපලක් ලෙස සිදුකර ගෙන යන බවත් ප්‍රදේශයේ ජනතාවට සහන මිලක් හෝ ලබා දෙන මුදලට සරිලන සාධාරණ සේවයක් ලබා නොදෙන බවත් මෙම ගවමස් වෙළඳසැල මීට පෙර දේශපාලන සහයෝගය යටතේ තනිපුද්ගල උදව් ලබා ගනිමින් හා අල්ලස් ලබාදී නීතියට පටහැනිව ක්‍රියා කරමින් මෙම වෙළඳසැල ලබාගෙන ඇති බවත් එබැවින් නිසි ටෙන්ඩර් පටිපාටියට අනුව මෙම වෙළඳසැල ලබා දෙන්නේ නම්, රුපියල් ලක්ෂ තිහකට අධික මුදලක් උපයා ගතහැකි බැවින් ජනතාවට සාධාරණය ඉටුකරන ව්‍යාපාරිකයින් හට ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලුම් කර ඇත. ජනතාවගේ ඉල්ලීම පිළිබඳව සාකච්ඡාකර තීරණයක් ලබාගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කණුල්වෙල බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ගවමස් වෙළඳසැලේ අයිතිය බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන ටෙන්ඩර් ලබාදීමට සුදුසු බවත් එමඟින් සභාවට විශාල ආදායමක් උපයා ගතහැකි බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

දැනට මෙම ගවමස් වෙළඳසැල පවත්වා ගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාරික මහතා හට මෙම ගවමස් වෙළඳසැලෙහි අයිතිය තහවුරු කරන ලෙස දන්වා යැවීමටත් කණුල්වෙල ප්‍රදේශයෙන් ගවමස් වෙළඳසැල පවත්වාගෙන යාමට කණුල්වෙල ප්‍රදේශයෙන් කඩකාමරයක් බිබිල ප්‍රාදේශීය සභාව විසින් කුලියට ලබාගෙන එම කඩ කාමරය ටෙන්ඩර් කර කණුල්වෙල ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සුදුසු බවත් 2026 වර්ෂයට වාර්ෂිකව ටෙන්ඩර් කිරීමට නොහැකි වුවහොත් මෙම ටෙන්ඩරය 2026 වර්ෂයේ මාස 6කට ලබාදීමට සුදුසු බවත් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක් කණුල්වෙල ප්‍රදේශයේ ඇත්දැයි සොයා බලා එසේ තිබේ නම් එම ඉඩම් කොටසෙහි කඩිනමින් ගොඩනැගිල්ලක් ඉදිකොට ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට ඩෙන්ඩර් කිරීමට සුදුසු බවත් තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.12.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමරවල ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් දීර්ඝකාලීන බදු ලබා දෙනු ලබන කඩකාමර වලින් ගිවිසුම් ප්‍රකාරව පහත පරිදි ප්‍රමාද ගාස්තු අය කරනු ලබයි.

| අනු අංකය | කඩ කාමර | අයකරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය |
|---|---|---|
| 01 | බිබිල පොදු වෙළඳපොල | දිනකට 1% |
| 02 | බහුකාර්ය ගොඩනැගිල්ල | දිනකට 1% |
| 03 | බිබිල දොඩම්ගොල්ල කඩ කාමරය | දිනකට 1% |
| 04 | බිබිල එළවළු වෙළඳපොල | දිනකට 1% |
| 05 | ළමා උද්‍යානය කිරිහල | දිනකට 1% |
| 06 | සතොස ගොඩනැගිල්ල | මසකට 10% |
| 07 | හෙළ බොජුන්හල | මසකට 10% |
| 08 | නව වෙළඳ සංකීර්ණය | මසකට 5% |

දීර්ඝකාලීන බදු පදනම මත බිබිල පොදු වෙළඳපොල කඩකාමර බදු ලබාගෙන ඇති බදුකරුවන් විසින් තමාගෙන් අයකරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය අඩු කරන මෙන් ඉල්ලීමක් සිදුකර ඇත. එම ඉල්ලීම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් සිදුකල අතර ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල පොදු වෙළඳපල කඩකාමර වලින් දැනට අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය වන දිනකට 1%ක ප්‍රමාණය මසකට 5% ක් දක්වා අඩු කිරීමටත් මෙම කඩ කාමරවල නව ගිවිසුම අත්සන් කිරීමේදී අයකරනු ලැබූ පරණ කීමනි මුදලත් එම කීමනි මුදලින් 50%ක මුදලකුත් එකතු කර නව කීමනි මුදල වැඩිකර අය කිරීමටත් මෙතෙක් පොදු වෙළඳපල කඩ කාමර කිහිපයක මාසික කුලිය හා ප්‍රමාද ගාස්තු නොගෙවීම නිසා ගිවිසුම් අවලංගු වී ඇති කඩකාමර හිමියන්ගේ ගිවිසුම් අවලංගු කල දින සිට මේ දක්වා ගෙවීමට ඇති කඩකුලිය හා ප්‍රමාද ගාස්තු අය කිරීමටත් එම ගිවිසුම් අවලංගු කරන ලද කඩ හිමියන්ට නව ගිවිසුම් වලට එළඹ මෙම කඩකාමර ලබාදීමටත් ඒ අය සමඟ මෙම කඩ කුලිය හා ප්‍රමාද ගාස්තු ගෙවිය හැකි කාල සීමාව තීරණය කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.13.බිබිල බස් නැවතුම්පොලට යාබදව ඇති කඩකාමර සම්බන්ධවයි.

බිබිල බස් නැවතුම්පොළට යාබදව වම්පස ඉදිකර ඇති වෙළඳකුටි තාවකාලික බඳු ගිවිසුමක් යටතේ 2022 වර්ෂයේ බදු දී තිබේ. 2023 වර්ෂයේදී මෙම තාවකාලික බඳු ගිවිසුම අවලංගු කර ඇත. එසේම මෙහි ඇතැම් බඳුකරුවන් එම කඩකාමර අතුරු බඳු දී තිබෙන බවද ආදායම් පරීක්ෂක කළ නිරීක්ෂණයේදී හෙලි දරව් වී ඇත.

මෙම ඉදිකිරීම් අනවසරයෙන් ඉදිකර ඇති බැවින් කඩ ඉවත් කර ගන්නා ලෙස දන්වා යැවුවද මේවන තෙක් ඉවත් කරගෙන නොමැත.

මේ සම්බන්ධව ඌව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක 12/4/2/5 හා 2025.09.03 දිනැති ලිපිය මඟින් මෙම අනවසර ඉදිකිරීම් පිළිබඳව සුදුසු කටයුතු කිරීමටද, අදාල කඩ හිමියන්ගේ ඉල්ලීම පිළිබඳ සලකා බලා වෙනත් විකල්ප ස්ථාන ලබාදීම හෝ සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මහ සභා තීරණයක් ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට සුදුසු බව දන්වා ඇත. එබැවින් එම කඩ කාමර පිළිබඳව තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කඩ කාමරවල වර්ග අඩි ප්‍රමාණ මැන බලා ඒ අනුව කීමනි මුදල හා මාසික කුලිය තීරණය කළහැකි බැවිනුත් මේවා අතුරු බඳු දී තිබේද යන්න පිළිබඳව හා මේ පිළිබඳව සවිස්තරව තොරතුරු සොයා බලා ඉදිරි මාසික මහ සභාවකදී තීරණයක් ගැනීමට කල් තැබීම සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

- 2025 අගෝස්තු මස 22 වන දින පැවැත් වූ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2025 සැප්තැම්බර් 02 වන දින පැවැත් වූ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව

මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලිම.

2025 අගෝස්තු මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 8,364,646.72 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 1,566,144.75 |
| මුළු ලැබීම් | - රු.9,930,791.47 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,274,517.45 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 729,408.57 |
| ණය ආපසු ගෙවීම් | - රු. 199,353.82 |
| වෙනත් වියදම් | - රු. 1,485,100.00 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු. 10,688,379.84 |

**2025.08.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 9,466,913.45 |
| අක්කර බදු | - රු. 934.10 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 319,811.00 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 64,670.00 |
| කුලී මුදල් | - රු. 1,213,916.67 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,685,512.80 |
| එකතුව | - රු. 13,751,758.02 |

## 08.වෙනත් කරුණු

### ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.

බොකාගොන්න දේවාලයේ දේවාල සංවර්ධන සමිතියේ ලේකම් වශයෙන් තමා බොකාගොන්න මාර්ගය මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙස බිබිල ප්‍රාදේශීය සභාවෙන් කරන ලද ඉල්ලීම පරිදි එම මාර්ගය කඩිනමින් මෝටර් ග්‍රේඩර් කර සකස් කිරීම පිළිබඳව ස්තූතිය පුද කර සිටි අතර මන්ත්‍රීවරුන්ගේ සාමදාන විනිශ්චයකරුවකු ලෙස දිවුරුම්දීම පිළිබඳව විමසූ මන්ත්‍රීවරයා දිවුරුම්දීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙස ඉල්ලීමක්ද සිදු කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

අලුතින් ඉදිකළ පොදු වැසිකිලියේ පිරිමි සහ ගැහැණු පාර්ශව දෙකටම ඇතුළුවීම හා පිටවීම ඇත්තේ එකම දොරටුවෙන් බවත් එය පොදු වැසිකිලියකට නුසුදුසු බවත් එය කඩිනමින් නිවැරදිව සකස් කළයුතු බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.**

අලුතින් ඉදිකළ පොදු වැසිකිලිය භාවිත කිරීම සඳහා පාසල් ළමුන්ගෙන් රු.40.00ක මුදලක් අය කරන බැවින් පාසල් ළමුන්ගෙන් මුදල් අය නොකරන්නේ නම් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

පළාත් සභාව මඟින් බිබිල ප්‍රාදේශීය සභාවට ලැබීමට ඇති ප්‍රතිපාදන මඟින් අලුතින් ඉදිකර ඇති පොදු වැසිකිලියෙහි දොර වෙනස් කර නිවැරදි ආකාරයට දොරක් ස්ථාපිත කිරීමට තීරණය කර ඇති බවත් මෙම වැසිකිලිය ඉදිරියෙහි පාසල් ළමුන්ගෙන් හා පූජ්‍ය පක්ෂයෙන් මුදල් අය නොකරන බව පුවරුවක් මගින් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන බවත් මන්ත්‍රීවරුන් සාමදාන විනිශ්චයකරුවකු ලෙස දිවුරුම්දීම පිළිබඳව ඉදිරියේදී දැනුම්දෙන බව පැවසූ ගරු මූලාසනය , 2025 සැප්තැම්බර් මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025 ඔක්තොබර් මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත ඔක්තොබර් 21 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව සැප්තැම්බර් මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -

01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි

| |
|---|
| සිදුවී ඇති මුද්‍රණ දෝෂයක් හේතුවෙන් යථා පරිදි කල්දී ඇති යෝජනා අංක 05.01.03 හි බඳුකරු විසින් ගෙවිය යුතු මුදල ලෙස සටහන් වී ඇති රු.666,3229.92 ක මුදල රු.666,329.92 ක් විය යුතු බවත් අංක 05.01.06 යෝජනාවෙහි සටහන් වී ඇති ගෙවිය යුතු ඉන්ධන වියදම රු.200,000.00ක මුදල රු.2,000,000.00 ක් ලෙස සංශෝධනය වියයුතුය. |